හන්තාන රජ මාවත විහාරය	411		
විශේෂ කාර්ය බලකාය (අගමැති ආරක්ෂක ඒකකය)	1,068,731		
අශෝකාර්ස් ජපන් (පුද්) සමාගම	6,240,000		
අපරාධ විමර්ශන කොට්ඨාශයෙන් ලැබිය යුතු	1,700,112		
එකතුව	318,410,551		318,410,551

17.5 පාරිභෝගික	චතුයායන්	ප්‍රධාන කාර්යාලය	පාරිභෝගික අංශය	2021.12.31 රු. එකතුව	2020.12.31 රු. එකතුව
ලැබිය යුතු ගිණුම්			88,520,793		
ණයගැනි ප්‍රතිපාදන			(857,605)		
එකතුව			87,663,189		
18.					
මුදල් හා ද්‍රවශීල වත්කම්					
ලංකා බැංකුව 80669453		119,130		119,130	58,528
ලංකා බැංකුව 8624530		16,370,978		16,370,978	13,298,791
චතු බැංකු ශේෂය	12,077,856			12,077,856	7,542,523
ලංකා බැංකුව75646976		56,064,807		56,064,807	1,583,928
ස්ථාවර තැන්පතු මහජන බැංකුව/හැටන් නැෂනල් බැංකුව				-	
ලංකා බැංකුව 2164625		-		-	-
ලංකා බැංකුව 2327555		1,295,143		1,295,143	2,831,561
මහජන බැංකුව 014200183155909			209,188	209,188	203,013
මහජන බැංකුව 014100103155909		139,771		139,771	139,771
ලංකා බැංකුව 034021		120,160		120,160	524,033
මහජන බැංකුව 003200100022296		10,268		10,268	9,965
ලංකා බැංකුව - යාපනය		-		-	-
මාර්ගස්ථ මුදල්	261,352		7,060	268,412	1,901,742
මාර්ගස්ථ මුදල්	1,181,989			1,181,989	191,031
අතැති මුදල්	316,804	(130,152)	5,000	191,653	246,230
අතැති මුදල් - ප්‍රාදේශීය කාර්යාලය	62,422			62,422	62,422
ලංකා බැංකුව - හයිඩ්පාර්ක් 2327553			35,712,052	35,712,052	-
මුදල් හා ද්‍රවශීල වත්කම්	-			-	-
සුළු මුදල් - ප්‍රාදේශීය කාර්යාලය		73,269		73,269	
ජංගම ගිණුම - ලංකා බැංකුව 2327572		2,754		2,754	4,000
ජංගම ගිණුම - ලංකා බැංකුව 2327554		1,880,067		1,880,067	
	13,900,423	75,946,197	35,933,300	125,779,920	28,597,537

19	වතුයායන්	ප්‍රධාන කාර්යාලය	පාරිභෝගික අංශය	2021.12.31 රු. එකතුව	2020.12.31 රු. එකතුව
ප්‍රකාශිත ප්‍රාග්ධනය					
ප්‍රකාශිත ප්‍රාග්ධනය		3,670,000,000		3,670,000,000	3,670,000,000
	-	3,670,000,000	-	3,670,000,000	3,670,000,000
20.					
ප්‍රාග්ධන සංචිත					
ප්‍රාග්ධන සංචිත ගිණුම	-	1,965,050,475	-	1,965,050,475	1,965,050,475
ප්‍රාග්ධන සංචිත ප්‍රදාන	-	656,308,762	-	656,308,762	656,308,762
ඉඩම් විකුණුම් ආදායම් ගිණුම	-	270,284,056	-	270,284,056	208,110,398
වත්කම් විකිණීමෙන් ලද ආදායම	-	5,667,581	-	5,667,581	5,667,581
මෝටර් රථ විකිණීමෙන් ලද ආදායම	-	-	-	-	-
	-	2,897,310,874	-	2,897,310,874	2,835,137,216
21.					
සාමාන්‍ය සංචිත/රාජ්‍ය ප්‍රදාන					
සාමාන්‍ය ප්‍රදාන	-	294,323,455	-	294,323,455	287,922,808
වැවිලි සංවර්ධන ව්‍යාපෘති	-	16,028,738	-	16,028,738	16,028,738
	-	310,352,193	-	310,352,193	303,951,546
21.1 සාමාන්‍ය සංචිත					
සාමාන්‍ය සංචිත ගිණුම	-	224,486,712	-	224,486,712	224,486,712
සාමාන්‍ය සංචිත ගිණුම	-	55,280,753	-	55,280,753	55,280,753
නව වැවිලි සහනාධාර සංචිත	-	14,512,056	-	14,512,056	8,111,408
වැවිලි මානව සංවර්ධන අරමුදල	-	43,934	-	43,934	43,934
	-	294,323,455	-	294,323,455	287,922,808
22.					
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්					
වතු පාරිතෝෂික ප්‍රතිපාදන	840,393,847			840,393,847	640,138,907
පාරිතෝෂික ප්‍රතිපාදන ගිණුම		87,366,881		87,366,881	81,875,254
	840,393,847	87,366,881	-	927,760,728	722,014,161
23.					
බැංකු ණය					
මහජන බැංකු ණය අංක 3 ගිණුම - 0102298	-	22,970,327	-	22,970,327	22,970,327
ෆැන් ඒෂියා බැංකුව - 010063380119	-	-	-	-	-
ලංකා බැංකුව ණය අංක 712647723	-	-	-	-	-
ලංකා බැංකුව ණය හයිඩ් පාර්ක් අංක 2327554		46,569,720		46,569,720	138,623,537
ලංකා බැංකුව ණය අංක 2327554 (2021.11.30)		200,000,000		200,000,000	
	-	269,540,047	-	269,540,047	161,593,864
24.					
ගෙවිය යුතු පාරිතෝෂික - පැරණි සේවකයින්					
වතු පාරිතෝෂික අධිභාරය කණ්ඩායම් 2					
ගෙවිය යුතු පාරිතෝෂික	623,835,920			623,835,920	556,693,375
පාරිතෝෂික - නීති	10,443,053			10,443,053	8,402,484
වතු පාරිතෝෂික අධිභාරය	182,171,383			182,171,383	171,549,690
ගෙවිය යුතු පාරිතෝෂික - කණ්ඩායම් 1				-	-
ගෙවිය යුතු පාරිතෝෂික		1,921,262		1,921,262	4,104,783
පාරිතෝෂික අධිභාරය		73,812		73,812	73,812
	816,450,357	1,995,075	-	818,445,431	740,824,144

25.		ප්‍රධාන කාර්යාලය	පාරිභෝගික අංශය	2021.12.31 රු. එකතුව	2020.12.31 රු. එකතුව
පොලී දරණ ණය ගැනීම්					
වෙනත් ගෙවිය යුතු ණය					
රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන සංස්ථාව		119,887,859	13,202,472	133,090,331	132,710,531
හලාවත වැව්ලි සමාගම		76,427,397		76,427,397	73,227,397
ශ්‍රී ලංකා තේ මණ්ඩලය		34,000,000		34,000,000	35,000,000
ලංකා බනිජ වැලි (පුද්ගලික) සමාගම		5,000,000		5,000,000	10,000,000
ලංකා පිහන් සංස්ථාව		5,000,000		5,000,000	5,000,000
	-	240,315,256	13,202,472	253,517,729	255,937,929
26.					
බදු ණයහිමියෝ					
බදුකරුවෝ	5,452,725	-	-	5,452,725	-
මූල්‍ය බදු වගකීම්	-	136,160	-	136,160	136,160
බදු පොලී ගිණුම	-	(211,009)	-	(211,009)	(211,009)
අවිනිශ්චිත පොලිය	-	(776,371)	-	(776,371)	(776,371)
	5,452,725	(851,220)	-	4,601,505	(851,220)
27.					
තැරැව්කරුවන්ගේ අත්තිකාරම්					
මර්කන්ටයිල් ප්‍රොඩියුස් බ්‍රෝකර්ස් සමාගම	-	4,100,000	-	4,100,000	1,425,000
නාවලපිටිය වැව්ලි සමාගම	-	-	-	-	-
ජෝන් කිල්ස්	-	-	-	-	-
සමර්විල් සහ සමාගම	-	744,136	-	744,136	744,136
ජේ ඩී සහ පුත්‍රයෝ (පුද්ගලික) සමාගම	-	21,379	-	21,379	-
	-	4,865,515	-	4,865,515	2,169,136
28.					
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු					
ගෙවියයුතු වෙළඳ	25,231	143,290,771	5,278,648	148,594,651	148,090,453
ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් හා වේතන	128,651,608	6,314,578		134,966,186	144,307,183
විවිධ ණය ගැතියෝ	153,861,437	101,228,152	131,510	255,221,099	271,212,903
ගෙවිය යුතු වැට් බදු		75,667,850		75,667,850	78,557,447
ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු	-	9,619,670		9,619,670	10,009,293
ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු	-	6,400,313		6,400,313	6,400,313
අන්තර් වතු මාරු කිරීම	3,073,189			3,073,189	2,815,594
සේවක ප්‍රසාද දීමනා	2,461,061			2,461,061	2,323,776
මුද්දර බදු	-	325,041		325,041	547,875
උපයනවිට ගෙවීමේ බදු	-	47,314		47,314	47,314
රහතුන්ගොඩ වතු පාලන ගිණුම	-	-		-	255,184
සභාපතිතුමාගේ සුභසාධන අරමුදල		2,307,465.05		2,307,465	2,365,672
	288,072,526	345,201,154	5,410,158	638,683,838	666,933,007
28.1.					
ගෙවිය යුතු වෙළඳ					
වෙනත්	25,231.20	103,270,654	3,778,648	107,074,533	106,370,335
මහවැලි නිවාස ව්‍යාපෘතිය	-	36,310,518	-	36,310,518	36,310,518
රාජ්‍ය විවිධ නීතිගත සංස්ථාව	-	3,709,600	-	3,709,600	3,909,600
එම් සි එම් මාර්කටින්	-	-	1,500,000	1,500,000	1,500,000
	25,231	143,290,771	5,278,648	148,594,651	148,090,453

28.1. ගෙවිය යුතු වෙළඳ	වතුයායන්	ප්‍රධාන කාර්යාලය	පාරිභෝගික අංශය	2021.12.31 රු. එකතුව	2020.12.31 රු. එකතුව
වෙනත්					
උපචිත වියදම්	25,231.20			25,231	
ණයගිමියන්		79,190		79,190	
සීඅයිසී ඇග්‍රෝ (පෞද්ගලික) සමාගම		479,697		479,697	
ඒ සිරිල් පෙරේරා (ආපසු ගෙ.යු.)		18,110		18,110	
ග්ලෝබල් ටී බෑග් පාලන ගිණුම		17,671		17,671	
සතොස මෝටර්ස් (පෞද්ගලික) සමාගම		1,951,140		1,951,140	
චාර්ෂික ආරක්ෂික තැන්පතු		10,342,462		10,342,462	
තක්සේරු ගාස්තු ගිණුම		2,287,331		2,287,331	
සමාජ සුභසාධන වැඩසටහන් ගිණුම		292,458		292,458	
ආරක්ෂක බෑදුම්කරය		1,998,463		1,998,463	
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන		2,334,930		2,334,930	
ප්‍රාදේශීය කාර්යාල ජන තේ විකුණුම්		14,027		14,027	
අවලංගු කල චෙක්පත් ගිණුම		-		-	
ජන තේ ණයගිමියෝ - 2005		296,400		296,400	
අයි සී එස් එල් (නව)		1,929,241		1,929,241	
SRC සඳහා ලූලකඳුර මංපෙත්		18,730		18,730	
වතු නිවාස සහ සමාජ සුභසාධන භාර ගිණුම		17,857,067		17,857,067	
දඩ මුදල් පාලන ගිණුම		182,665		182,665	
බදු ගිණුම		62,601,856		62,601,856	
ජන තේ අවිනිශ්චිත ගිණුම		5,598		5,598	
ප්‍රධාන කාර්යාල අවිනිශ්චිත ගිණුම		315		315	
තේ මණ්ඩල අරමුදල් ගිණුම		491,304		491,304	
වෙළඳ ණයගිමියන්ගේ අපනයන ගිණුම		72,000		72,000	
විවිධ ණයගිමියෝ			291,579	291,579	
ප්‍රාදේශීය කාර්යාල අවිනිශ්චිත ගිණුම			-	-	
ජනවසම ප්‍රාදේශීය කාර්යාලය			3,487,070	3,487,070	
	25,231	103,270,654	3,778,648	107,074,533	
28.2					
ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් හා චේතන					
නිවාඩු දින වැටුප්	40,047,522	-	-	40,047,522	41,133,975
කාර්ය මණ්ඩල හා සේවක අඩු කිරීම්	23,614,550	4,255,876	-	27,870,427	39,150,481
ගෙවිය යුතු චේතන	52,631,908	118,280.52	-	52,750,189	52,491,622
කාර්ය මණ්ඩල වෛද්‍යාධාර යෝජනා ක්‍රමය	9,120,669	532,532.62	-	9,653,201	9,719,038
හිමිකම් නොපෑමේ චේතන	3,236,959	1,407,888.21	-	4,644,847	1,812,068
	128,651,608	6,314,578	-	134,966,186	144,307,183

28.2.1 ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් හා චේතන	වතුයායන්	ප්‍රධාන කාර්යාලය	පාරිභෝගික අංශය	2021.12.31 රු. එකතුව	2020.12.31 රු. එකතුව
කාර්ය මණ්ඩල/සේවක අඩුකිරීම්				-	
කාර්ය මණ්ඩල සුභසාධන G1+G2	668,850			668,850	
සේවක සුභසාධන	-			-	
ස්වං උපකාර ව්‍යාපෘති ණය	-			-	
කාර්ය මණ්ඩල අයකරගැනීම්	1,921,697			1,921,697	
කාර්ය මණ්ඩල වැටුප්	2,423,582			2,423,582	
කාර්ය මණ්ඩල සුභසාධන	1,896,878			1,896,878	
සේවක වෘත්තීය සංගම්	16,703,544			16,703,544	
වැටුප් අඩුකිරීම්		-		-	
ක්‍රීඩා සමාජ		100,661		100,661	
කාසි		42,394		42,394	
ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් හා චේතන		29,625		29,625	
බැංකු ණය		-		-	
රක්ෂණ		3,874,876		3,874,876	
වෘත්තීය සංගම් දායකත්ව මුදල්		208,320		208,320	
එකතුව	23,614,550	4,255,876	-	27,870,427	
28.2.11					
ගෙවිය යුතු චේතන					
කම්කරු වැටුප් ගිණුම	52,631,908			52,631,908	
හිඟ වැටුප් අත්තිකාරම්		118,281		118,281	
එකතුව	52,631,908	118,281	-	52,750,189	
28.2.111					
කාර්ය මණ්ඩල වෛද්‍යාධාර යෝජනා ක්‍රමය					
කාර්ය මණ්ඩල වෛද්‍යාධාර යෝජනා ක්‍රමය	-			-	
කාර්ය මණ්ඩල වෛද්‍යාධාර	9,120,669			9,120,669	
ගෙවිය යුතු කාර්ය මණ්ඩල වෛද්‍යාධාර		532,533		532,533	
ගෙවිය යුතු විධායක කාර්ය මණ්ඩල වෛද්‍යාධාර		-		-	
එකතුව	9,120,669	532,533	-	9,653,201	
28.2.1v					
හිමිකම් නොලබන වැටුප්					
හිමිකම් නොලබන වැටුප්	451,549			451,549	
හිඟ කම්කරු වැටුප් - 2019	2,785,409			2,785,409	
වැටුප් ප්‍රතිශෝධනය වෙනුවෙන් විශේෂ අත්තිකාරම්		1,407,888		1,407,888	
එකතුව	3,236,959	1,407,888	-	4,644,847	
28.3					
විවිධ ණයහිමියෝ					
වෙනත්	75,924,930	15,794,870	-	91,719,801	97,656,096
වෙළඳ ණයහිමියෝ	76,897,578	-	16,800	76,914,378	86,858,171
ආපසු ගෙවිය හැකි තැන්පතු	-	70,200,884	-	70,200,884	71,219,226
උපචිත වියදම්	1,038,929	15,232,398	114,710	16,386,036	15,479,410
	153,861,437	101,228,152	131,510	255,221,099	271,212,903

28.3.1 වෙනත්	වතුයායන්	ප්‍රධාන කාර්යාලය	පාරිභෝගික අංශය	2021.12.31 රු. එකතුව	2020.12.31 රු. එකතුව
ජනවසම බෞද්ධ සංගමය		348,194		348,194	
නොතාරිස් ගාස්තු		1,044,581	-	1,044,581	
206013 · විවිධ ණයහිමියෝ	5,000			5,000	5,000
වතුවල නොවන ණයහිමියෝ	16,161,858			16,161,858	15,760,247
විවිධ ණයහිමියෝ G1	43,747,078			43,747,078	44,575,354
ගෙවිය යුතු කාර්ය මණ්ඩල/සේවක	8,722,079			8,722,079	3,262,878
විවිධ ආදායම් - වතුයායන්	-			-	
ප්‍රධාන කාර්යාල කොවිඩ් අරමුදල		35,982		35,982	
මහනුවර ප්‍රාදේශීය කාර්යාල ගිණුම	-	11,788,352	-	11,788,352	13,828,888
විගණන ගාස්තු	4,222,264		-	4,222,264	4,005,929
වතු පාලන ගිණුම	3,044,829	-	-	3,044,829	13,618,215
ප්‍රාදේශීය කාර්යාල අවිනිශ්චිත ගිණුම	-	1,863,756	-	1,863,756	1,863,756
දඩ	-	-	-	-	-
පෙර ගෙවුම්	-	688,440	-	688,440	688,440
රක්ෂණ වාරික	-	-	-	-	-
ගෙවිය යුතු S N C ගිණුම	-	25,566	-	25,566	25,566
තැන්පතු	-	-	-	-	-
ප්‍රාදේශීය කාර්යාල පාලන ගිණුම	21,822	-	-	21,822	21,822
එකතුව	75,924,930	15,794,870	-	91,719,801	97,656,096
28.3.11					
වෙළඳ ණයහිමියෝ					
ලැබිය යුතු වෙළඳ හා වෙනත් :104009 · (කැරොලිනා වතුයාය)	79,640			79,640	79,640
ලංකා පොහොර සමාගම	768,600			768,600	768,600
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	5,744,869			5,744,869	5,233,308
වතුවල ණයහිමියෝ G1	-			-	-
වතුවල ණයහිමියෝ G2	34,004,552			34,004,552	33,143,310
කොටස් මිළදීගැනීම අත්හිටුවීම				-	-
වෙළඳ ණයහිමියෝ	36,299,918			36,299,918	47,633,313
ජනවසම වතුයායන්වල කිතුල් පැණි සපයන්නා			16,800	16,800	
	76,897,578	-	16,800	76,914,378	86,858,171

		වතුයායන්	ප්‍රධාන කාර්යාලය	පාරිභෝගික අංශය	2021.12.31 රු. එකතුව	2020.12.31 රු. එකතුව
ආපසු ගෙවිය හැකි තැන්පතු	28.3.111					
ආපසු ගෙවිය හැකි තැන්පතු ගිණුම			65,909,006		65,909,006	68,859,348
ආපසු ගෙවිය හැකි තැන්පතු ගිණුම - ඉඩම්			4,291,878		4,291,878	2,359,878
එකතුව		-	70,200,884	-	70,200,884	71,219,226
28.3.1V						
උපචිත වියදම්						
උපචිත වියදම්			15,232,398		15,232,398	13,344,345
උපචිත වියදම් -ඩබ් ඉන්ෆෝමේෂන් සමාගම			-		-	-
උපචිත වියදම්			0	114,710	114,710	114,710
උපචිත වියදම් - වතුයායන්		1,038,929			1,038,929	2,020,355
එකතුව		1,038,929	15,232,398	114,710	16,386,036	15,479,410
	29					
සේ.අ.අ./ව.සේ.අ.අ./ව.හා.අ.අ						
සේ.අ. අරමුදල්		978,544,519	29,638,019		1,008,182,538	872,943,182
වතු සේ.අ.අරමුදල්		85,391,624	46,057,230		131,448,854	95,998,165
ල.හා. අ.අරමුදල		23,859,709	1,901,899		25,761,608	19,454,472
		1,087,795,853	77,597,148	-	1,165,393,001	988,395,820
	29.1					
සේවක අර්ථසාධක අරමුදල්						
ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල්		160,774			160,774	160,774
ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල්		720,991,385			720,991,385	496,227,904
ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් - නීති		242,324,056			242,324,056	343,545,425
ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් ගිණුම			29,638,019		29,638,019	20,748,482
ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් -අධිභාරය		12,388,314			12,388,314	12,421,371
සංසන්දනය නොකරන ලද සේවක අර්ථසාධක අරමුදල්		2,679,990			2,679,990	
එකතුව		978,544,519	29,638,019	-	1,008,182,538	872,943,182
	29.2					
වතු සේවක අර්ථසාධක අරමුදල්						
ගෙවිය යුතු ව.සේ.අ.අ.		59,478,178			59,478,178	54,124,786
ව.සේ.අ.අ. නීති		156,726			156,726	156,726
ව.සේ.අ.අ. ගිණුම			44,857,792		44,857,792	25,527,093
ආපසු ගෙ.යු. ව.සේ.අ.අ. ගිණුම			1,199,438		1,199,438	1,199,438
ව.සේ.අ.අ. අධිභාරය		25,756,721			25,756,721	14,990,123
එකතුව		85,391,624	46,057,230		131,448,854	95,998,165
	29.3					
ල.හා.අ.අ.						
ල.හා.අ.අ. ගිණුම			1,895,646		1,895,646	1,404,349
ආ.ගෙවිය යුතු ල.හා.අ.අ. ගිණුම			6,254		6,254	6,254
ගෙවිය යුතු ල.හා.අ.අ.		23,210			23,210	23,210
ගෙවිය යුතු ල.හා.අ.අ.		22,124,429			22,124,429	16,441,646
ල.හා.අ.අ. අධිභාරය		1,679,013			1,679,013	1,579,013
ල.හා.අ.අ. ගිණුම (නීති)		33,057			33,057	
එකතුව		23,859,709	1,901,899	-	25,761,608	19,454,472
	30					
ගෙවිය යුතු සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සහ වෙනත්						
සේ.නි.හා.අ. ගිණුම			9,260,152		9,260,152	4,776,411
ගෙවිය යුතු සේ.නි.හා.අ.		62,134,365			62,134,365	47,224,843
සේ.නි.හා.අ. නීති		10,949,332			10,949,332	11,811,246
ගෙවිය යුතු සේ.නි.හා.අ.		25,698			25,698	25,698
සේ.නි.හා.අ. අධිභාරය		835,855			835,855	407,089
සේ.නි.හා.අ. නීති					-	-
		73,945,249	9,260,152	-	83,205,401.03	64,245,286
	31					
තැන්පතු/දේපල බදු දීම නිසා ලැබූ අත්තිකාරම්						
බදු දේපල නිසා ලැබූ තැන්පතු		-	66,469,676		66,469,676	70,429,285
වෙනත්			116,246,652		116,246,652	124,611,169
		-	182,716,328	-	182,716,328	195,040,454

31.1				
බදු දේපළ තැන්පතු/අත්තිකාරම්	චතුයායන්	ප්‍රධාන කාර්යාලය	පාරිභෝගික අංශය	එකතුව
වත්කම් බදු සඳහා තැන්පතු				
ලීසිං සඳහා තැන්පතු		7,612,680		
ගොඩනැගිලි සඳහා තැන්පතු		385,000		
බදු තැන්පතු ගිණුම		41,605,331		
සී/ස රිසෙල්කා ඉන්ඩස්ට්‍රිස් (පෞද්ගලික) සමාගම		16,866,665		
එකතුව	-	66,469,676	-	
31.2				
වෙනත්				
ලැබිය යුතු ගිණුම		12,513,512		
සී වරුසවිතාන මහතා (වතුරවිල)		5,927,406		
ඒෂියන් කටින්ස් (පෞද්ගලික) සමාගම		-		
උලපනේ පඤානන්ද හාමුදුරුවෝ (දික්ඔය)		357		
ජී ඩී සේනාවීර මහතා (ගොඩවානාකන්ද)		-		
එස් එම් මාපා මහතා (මවුන්ට්පර්ල්)		-		
වෝලකන්ද තරුණ මධ්‍යස්ථානය (මොන්ට්ක්‍රිස්ටෝ)		-		
ආර් පී ජයරත්න මහතා (නාවල)		426,374		
පී එච් ජේ ජයවික්‍රම මහතා (කැරොලිනා)		320,867		
ශ්‍රී ජිනරතන අධ්‍යාපන ආයතනය		430,143		
යූ සෝමරත්න හාමුදුරුවෝ (වලව්වත්ත)		-		
එම් කේ ඊ පියතිලක මහතා (කොලදාව්ච්)		-		
පී සී බී රඹුක්පොත මහතා (රත්කොටමලේ)		-		
ආරුමුගම් මහතා (බෲක්සයිඩ්)		1,586		
ඩබ් පී පෙරේරා මහතා (ගුරුක්ඔය)		192,274		
එම් එච් එම් මුස්තාපා මහතා (පොග්මෝ)		-		
එන් ආර් හයිඩ්‍රෝ ෆවර් (කොලපතන)		154,876		
මවුන්ට් ග්‍රීන් වැව්ලි (පෞද්) සමාගම		2,094,400		
එස් ඩබ් වීරසිංහ මහතා (හීන්පොල)		-		
රේණුකා හේරත් මිය (මාවත්ත)		42,586		
පී එල් ඩී ජේ සෙනවිරත්න මහතා (සමන්තා)		-		
ඩී පී ඩැනියෙල් මහතා (දුරේකන්ද)		4,746,000		
සී ඩී පෙරේරා මහතා (ගහරාව)		-		
එච් ඩී එල් හපුආරච්චි මහතා (ඉදුරුගල්ල)		70,078		
ඒ බී විජේසුන්දර මහතා (සෙන්ජෙරාඩ්)		1,789,692		
එම් ඩී ටී ගුණතිලක මහතා (සිදුරුපිටිය)		3,189		
පෙරාජ් මයිනින් (අම්බලමාන)		106,928		
නාසෙවන ව්‍යාපෘති (පෞද්ගලික) සමාගම		-		
විහාරස්ථ කාර්ය සාධන (හන්තාන)		91,600		
ආර් පී වසන්ති මහත්මිය (පාක්කුපව්චෝලෙයි)		220,017		
එච් ඒ ප්‍රේමදාස මහතා (පාක්කුපව්චෝලෙයි)		347,616		
කේ එස් එස් සත්‍යදාසන් මහතා (ලෙවලන්)		550,000		
එකෝටෙල්ස් (පෞද්ගලික) සමාගම		46,539,035		
එස් ටී එල් එම් ජැනට් කොස්තා		-		
හන්තාන රජ මාවත විහාරය		-		
ලැබිය යුතු බදු කුලී ගිණුම		469,542		
අශෝක ග්ලාස් මිරර්		-		
වැව්ලි අමාත්‍යාංශය		684,699		
මිස්ටර් ජේන්ට් ලංකා (පෞද්ගලික) සමාගම		-		
නිලෝනා ලංකා (පෞද්ගලික) සමාගම		7,831,226		

	වතුයායන්	ප්‍රධාන කාර්යාලය	පාරිභෝගික අංශය	එකතුව
හලාවත වැවිලි සමාගමෙන් ලැබිය යුතු		-		
කන්තලේ සීනි සමාගමෙන් ලැබිය යුතු		199,826		
රබර් සංවර්ධන මණ්ඩලය		4,187,974		
නාවලපිටිය වැවිලි (පෞද්ගලික) සමාගම		-		
ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය (පලෙයි වත්ත)		1,130,772		
ඩබ් පී පෙරේරා (කුල්බෝන්) ජල විදුලි බලාගාර		7,701,151		
බෝතලේ රාහුල හාමුදුරුවෝ		-		
ගිහාන් සෝමසිරි මහතා (ගලහ)		-		
ධර්මවිජයාරාමය (මොන්ට ක්‍රිස්ටෝ)		-		
උඩුපුස්සැල්ලාව වැවිලි සමාගම		20,000		
එම් ජී එම් බණ්ඩාරතිලක මහතා (ගලහ)		45,684		
එම් මුත්තුලිංගම් මහතා (පාක්කුපවිචෝලෙයි)		703,800		
ඩබ් ඩී කේ කළුආරච්චි (ලබුගොඩකන්ද)		243,627		
ලේක්සයිඩ් ෆොපර්ටි (ටී බී ජයා මාවත)		(3,999,999)		
ඇස්කොට් ටී (පෞද්ගලික) සමාගම		259,500		
එම් රත්නසිංහ මහතා (ලොට් 3 පාක්කුපවිචෝලෙයි)		125,178		
ශ්‍රී ලංකා ටෙලිකොම්		79,416		
ආර් එම් මාලක ලක්ප්‍රිය (පඹුරුපිටිය)		-		
ලේක් සයිඩ් ප්‍රොපර්ටි		10,257,784		
අවිනි උදේශිකා මිය (ගොඩවානාහේන)		999,900		
ඩබ් පී පෙරේරා (ගුරුක්ඔය)		-		
ආර් එස් ආර් ජී කරුණාරත්න මයා (මවුන්ටපර්ල්)		931,574		
නාවලපිටිය වැවිලි (පෞද්ගලික) සමාගම (මොන්ට ක්‍රිස්ටෝ)		-		
ෆෝබ්ස් සහ චෝකර්ස් තේ තැරැව්කරුවෝ		95		
සන්ටැක් පවර් (පෞද්ගලික) සමාගම		-		
නෝමන් හාලි මහතා (මල්ගොල්ල)		-		
කපු සංස්ථාව (කුමාරවත්ත)		32,537		
ප්‍රිහාන් හෝල්ඩින්ස් (පෞද්ගලික) සමාගම		-		
එච් ආර් සරත් ගාමිණී පීරිස් මහතා		27,370		
ප්‍රියානා විතානගේ මිය (ඉඳුරුගොල්ල)		302,479		
එස් එන් ප්‍රනාන්දු මහතා (විලියමුල්ල)		297,770		
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය		11,582		
ක්‍රිශාන් පෙරේරා මහතා (කලුමලේ)		4,616		
ඩබ් එම් මාෂල් මහතා (කුඩාදොළ)		402,509		
මාදොළ මල්ටි ප්ලාන්ටේෂන් (පෞද්) සමාගම		11,566		
ඊසර්ට් පුත්‍රයෝ (රිළාගල)		164,039		
එම්ටීවී වැනල් (පෞද්ගලික) සමාගම (හන්තාන)		284,650		
හරන්ගල තේ කර්මාන්තශාලාව (හරන්ගල)		5,763,482		
රාජ්‍ය දැව සංස්ථාව (කුමාරවත්ත)		5,494		
ජී ජේ කේ වන්ද්‍රසේන මහතා (පාක්කුපවිචෝලෙයි)		4,990		
එම් එළී ටී මාරසිංහ මහතා (පාක්කුපවිචෝලෙයි)		1,315		
කේ එළී ඩී වන්ද්‍රසේන මහතා (පාක්කුපවිචෝලෙයි)		2,890		
එච් එස් කාලිංග මහතා (පාක්කුපවිචෝලෙයි)		835		
එම් පී හිරිපිටිය මහතා (සොමිසඳ)		228,901		
බ්‍රාවෝ හෝල්ඩින් ලංකා (පෞද්ගලික) සමාගම		-		
එම් රත්නසිංහ මහතා (පාක්කුපවිචෝලෙයි)		93,000		
ඩබ් සිසිර බණ්ඩාර (මාවත්ත)		68,342		
ජාතික මැණික් හා ස්වර්ණාභරණ		98,000		
එකතුව	-	116,246,652		

32

	චතුයායන්	ප්‍රධාන කාර්යාලය	පාරිභෝගික අංශය	2021.12.31 රු. එකතුව	2020.12.31 රු. එකතුව
බැංකු අයිරා					
ලංකා බැංකුව - හයිඩ් පාර්ක් 2327554		-		-	40,356,658
ලංකා බැංකුව - හයිඩ් පාර්ක් 2327553		-	-	-	396,614
මහජන බැංකුව -යුනියන් පෙදෙස 014100293155909		-	-	-	-
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව 006100003643		954		954	954
ලංකා බැංකුව - යාපනය	3,209			3,209	3,209
සුළු මුදල් ප්‍රාදේශීය කාර්යාලය				-	1
	3,209	954	-	4,163	40,757,436

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සටහන්

1. ආයතනික තොරතුරු

1.1 වාර්තාකරණ ස්ථිතිය

ජනතා වතු සංවර්ධන මණ්ඩලය 1972 අංක 11 දරණ කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ 1976 පෙබරවාරි 06 දිනැති අංක 199/1M දරණ ගැසට් නිවේදනය මගින් ස්ථාපනය කරන ලදී. ලියාපදිංචි කාර්යාලය සහ ව්‍යාපාරයේ ප්‍රධාන ස්ථානය අංක 55/75 වොක්ෂෝල් පටුමග, කොළඹ 02 හි පිහිටුවා ඇත.

1.2 මූලික කටයුතු හා මෙහෙයුම් ස්වභාවය

සලකන මූල්‍ය වර්ෂය තුල මණ්ඩලයේ මූලික කටයුතුවල ස්වභාවයේ සැලකිය යුතු වෙනසක් සිදු වී නොමැත. මණ්ඩලයේ මූලික කටයුතු වූයේ තේ හා රබර් වගා කිරීම, නිෂ්පාදනය සහ විකිණීමයි. ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් තැරැව්කරුවන් හරහා තේ අලෙවි කිරීම වෙනුවට (අගය එකතු කල නිෂ්පාදන) ප්‍රාදේශීය තේ අලෙවිසැල් (ජන තේ/පාරිභෝගික සේවාව) පවත්වා ගෙන යයි.

2. සූදානම්වීමේ පදනම

2.1 ආකූලතා ප්‍රකාශය

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ලාභ/අලාභ ප්‍රකාශය හා අනෙකුත් විස්තරාත්මක ආදායම්, මූල්‍ය තත්ව ප්‍රකාශය, මුදල් ගලා ඒමේ වෙනස්කම් දක්වන ප්‍රකාශය හා ගිණුම් රෙගුලාසි සහ මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් වලින් සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA of Sri Lanka) විසින් පනවා ඇති ශ්‍රී ලංකා ගණකාධිකරණ සම්මතයන්ට (SLFRS සහ LKAS) හා 1995 අංක 19 දරණ ශ්‍රී ලංකා ගණකාධිකරණ සහ විගණන සම්මත පනතට අනුව සකස් කර ඇත.

2.2 ඇගයුම් පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික වියදම් ගිවිසුම් පදනම් කරගෙන සකස් කර ඇත. අදාල විශේෂ රෙගුලාසි අනුප්‍රාප්තිය සටහන් මගින් විස්තර කර ඇත. මූලය ප්‍රකාශනවල උද්ධමනිය සාධක සඳහා අනුකූලනය සිදුකර නොමැති අතර මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් සකස් කර ඇත.

2.3 ඇස්තමේන්තු සහ විනිශ්චය භාවිතය

ශ්‍රී ලංකා ගණකාධිකරණ සම්මතයන්ට (SLFRSs/LKASs) අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී රෙගුලාසි ආදේහනයට සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණ වාර්තා කිරීමට බලපෑ හැකි තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන ගැනීමට කළමනාකරණයක් අවශ්‍ය වේ. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු කරන ලද අගයන්ට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ ඒ සම්බන්ධ උපකල්පන පදනම් වී ඇත්තේ අතීත අත්දැකීම් සහ එම තත්වය යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන වෙනත් විවිද සාධක මත වන අතර අනෙකුත් ප්‍රභවයන් ගෙන් පහසුවෙන් වෙනස් කල නොහැකි වත්කම් හා වගකීම් වල වටිනාකම පිළිබඳ තීරණ ගැනීමේ පදනම වන්නේ එහි ප්‍රතිඵලයයි

ඇස්තමේන්තු සහ උපකල්පන අඛණ්ඩ පදනමින් සමාලෝචනය කරනු ලැබේ. සංශෝධන, එම මූල්‍ය වර්ෂයට පමණක් බලපෑම් ඇති කරයි නම් එම කාල පරිච්ඡේදයේදී සංශෝධන එම මූල්‍ය වර්ෂයට සහ අනාගත මූල්‍ය වර්ෂය සඳහා බලපෑම් ඇති කරයි නම් සංශෝධන කාලපරිච්ඡේදය සහ අනාගත කාලපරිච්ඡේද වලදීද ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන සංශෝධන හඳුනා ගැනේ.

2.4 ඉදිරි ගමන

ආයතනයේ ඉදිරි ගමන සඳහා මණ්ඩලය පොදු, පෞද්ගලික සහ සේවක (PP & E) හවුල්කාරී සංකල්පයක් තුල නැවත ප්‍රතිව්‍යුහගත කිරීමට අධ්‍යක්ස මන්ඩලය තිරණය කර ඇත. භාවිත නොකල හෝ අවම වශයෙන් භාවිතා කල වත්කම් සහ දේපල පෞද්ගලික ආයෝජකයන් සමග කරන හවුල් ව්‍යාපාර සඳහා යෙදවීම අරමුණු කරගෙන වර්තමානයේදි ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන ආරම්බ කර ඇත. නව ආයෝජන මගින් අපේක්ෂිත ආදායම් වලින් ජනනය වූ ආදායම් යොදාගෙන ඉහ EPF සහ ETF පියවීම සිදුකරයි. ඉදිරිගමන පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති අතර ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක වනතුරු ඔවුන් කිසිදු ව්‍යාපාර කටයුත්තක් අතහැර දැමීම හෝ නතර කිරීම සිදු නොකරයි.

2.5 සංසන්දනාත්මක තොරතුරු

ගිණුම්කරණ ප්‍රතිපත්ති මණ්ඩලය විසින් පෙර වර්ෂයේ භාවිතා කල ප්‍රතිපත්ති සමග නිරන්තරයෙන් ක්‍රියාත්මක කර ඇත. වර්තමාන වසරේ දත්ත නිරූපනය කිරීම සඳහා අදාල ස්ථානවලදි මෙම සංඛ්‍යා සහ වාක්‍ය නැවත සකස්කිරීම සිදු කර ඇත.

2.6 වාර්තා කරන දිනට පසුව සිදුවන සිදුවීම්

මෙයට ඇතුලත් වන්නේ වාර්තාකරණ කාලයෙන් අවසන් වීමෙන් පසුව සිදුවන සිදුවීම් සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරන ලද දිනය අතර සිදුවන වාසිදායක හා අහිතකර සිදුවීම් වේ. වාර්තා කිරීමේ කාලයෙන් පසුව සිදුවන සිදුවීම්වල ද්‍රව්‍යමයභාවය සලකා බලනු ලබන අතර අවශ්‍ය අවස්ථාවන්හිදී මූලය ප්‍රකාශනවල සුදුසු වෙනස්කම් හෝ අනාවරණ කිරීම් සිදු කරනු ලැබේ.

3 අනෙකුත් තොරතුරු

3.1 ජනවසම - ගලබොඩ වතුයාය

මෙම වතුයාය උගස් කර ලබාගන්නා ලද බැංකු අයිරාව මෙම වසරේ පෙබරවාරි මස වනවිට ගෙවා නිම කර ඇත.

4 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන මගින් දක්වා ඇති සියළු කාල සඳහා පහත ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශනය කර ඇත.

4.1 ණයට ගැනීමේ පිරිවැය

සාමාන්‍ය සහ විශේෂිත ණයටගැනීමේ පිරිවැය, අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම්විමට සැලකිය යුතු කාලයක් ගතවන වත්කම් අත්පත් කරගැනිම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීමට සෘජුවම ආරෝපණය වන අතර එම වත්කම් විකිණීම සඳහා සූදානම් වන තෙක් එම වත්කම්වල පිරිවැයට එකතු කරනු ලැබේ

ණයගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය ආරම්භ වන්නේ එය වත්කම් සඳහා වියදම් දැරූ විට සහ වත්කම් අපේක්ෂිත භාවිතය හෝ විකිනීම සඳහා සූදානම් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමේදී වේ. වත්කම් අපේක්ෂිත භාවිතය සඳහා අවශ්‍ය කටයුතු සැලකිය යුතු තරම් සිදුවූ විට ප්‍රාග්ධනීකරණය නතර කරනු ලැබේ. සුදුසුකම් ලබන වත්කමක ක්‍රියාකාරී සංවර්ධනය අත්හිටුවන්නේ නම් ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය අත්හිටවනු ලැබේ.

මණ්ඩලය විසින් අරමුදල් ලබාගෙන ඒවා නොමේරූ තේ, රබර් හා කටුපොල් වතුයායන් වැනි වත්කම් සඳහා යොදා ගනියි. ඉහත පෙව වත්කම් සඳහා වන වියදම් සඳහා ප්‍රාග්ධනීකරණ අනුමැතියක් ආදේශ කිරීම මගින් ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ලබන ණයට ගැනීමේ පිරිවැය මණ්ඩලය විසින් තීරණය කරනු ලබයි. මෙම අරමුණ සඳහා මණ්ඩලය සාමාන්‍ය ණය ගැනීම් සඳහා අදාල වන ණය ගැනීමේ පිරිවැයේ සාපේක්ෂ මධ්‍යනය භාවිතා කරයි. අනෙකුත් සියළු ණයට ගැනීමේ පිරිවැය ඒවා සිදුකල කාලයට අදාල ලාභ අලාභ ප්‍රකාශයෙන් හඳුනාගනු ලබයි. නිශ්චිත ණය ගැනිම්වල තාවකාලික ආයෝජන මත උපයන ආයෝජන අදායම ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ලබන පිරිවැයෙන් සුදුසුකම් ලබන වත්කම් සඳහා ඔවුන්ගේ වියදම් කිරීම අඩු කල විට ලැබේ.

4.2 ඔවුන්ගේ තක්සේරුකරණයේ වත්කම් හා පදනම්

මූල්‍ය වත්කම් ප්‍රකාශයේ වත්මන් වත්කම් ලෙස වර්ගීකරණය කරන ලද වත්කම් වන්නේ මුදල් හා බැංකු ශේෂයන් සහ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල හෝ වාර්තාකරණ දින සිට වසරක් ඇතුලත මුදල් වලින් සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරන දේ වේ. වත්මන් වත්කම් හැර අනෙකුත් වත්කම් වන්නේ වාර්තා කරන දිනයේ සිට වසරකට වැඩි කාලයක් රඳවා ගැනිමට මණ්ඩලය තිරණය කරන වත්කම් වේ.
වර්තමාන නොවන වත්කම් දිගු කාලයක් තිස්සේ නැවත තක්සේරු කර නොමැති අතර එම නිසා මූල්‍ය ප්‍රකාශනවල වත්කම්වල වටිනාකම ලෙස සඳහන් අගයට වඩා වර්තමාන වටිනාකම වෙනස් විය හැකිය.

4.2.1 දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න හඳුනාගැනීම හා ගණනය කිරීම, පිරිවැය තක්සේරු කිරීමේදි ලබන අගයෙන් සමුච්චිත ක්ෂය විම් අඩු කිරීම මගින් සිදුකරන බව වාර්තා වී ඇත. දේපල. යන්ත්‍රෝපකරණ සහ ආම්පන්නවල පිරිවැය යනු මිලදි ගැනීමට හෝ ඉදිකිරීමට දැරීමට සිදුවන වියදම සහ එහි අපේක්ෂිත භාවිතය සඳහා වත්කම් එහි සේවා තත්වයට ගෙනඒම සඳහා වන ඕනෑම වියදමක් වේ.

අදාල උපකරණවල ක්‍රියාකාරිත්වයට ඒකාබද්ධ වී ඇති මිළදී ගත් මෘදුකාංගය උපකරණයේම කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇත. දේපල, යන්ත්‍රෝපකරන සහ ආම්පන්න වල වෙන් වූ කොටස් (ප්‍රධාන සංරචක) ලෙස සලකනු ලබයි.

4.2.2 පසුකාලින වියදම්

දේපලක, යන්ත්‍රෝපකරණයක හෝ ආම්පන්නයක කොටසක් නැවත ප්‍රතිස්ථාපනය කිරීම මගින් මණ්ඩලය වෙත අනාගතයේදි ආර්ථික ප්‍රතිලාභ ගලා එයි නම් එය එහි වටිනාකම තුලින් හඳුනාගෙන ඇති අතර එහි පිරිවැය විශ්වාසනියව මැනිය හැකිය. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි වටිනාකම දේපලෙහි, යන්ත්‍රෝපකරණවල සහ ආම්පන්නවල එදිනෙදා සේවා සැපයීම ලෙස ලාභ/අලාභ ප්‍රකාශනවල හඳුනාගෙන ඇත.

4.2.3 ක්ෂයවීම/ක්‍රමක්ෂය

ක්ෂයවීම, දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්නවල සෑම කොටසකම ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් කාලයට වඩා සෘජුවම ලාභය/අලාභය ලෙස හඳුනාගත හැකිය. වත්කමක් ක්ෂයවීම ආරම්භ වන්නේ එය භාවිතයට ගත හැකි විට වන අතර වත්කම ක්ෂය කිරීම, ඒවා විකිණීම සඳහා වර්ගීකරණය කර ඇති (හෝ විකිණීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කර ඇති බැහැර කිරීමේ පුවරුවකට ඇතුලත් කර ඇති) දිනට පෙර නතර වේ. සින්නක්කර ඉඩම් සඳහා ක්ෂය කිරීම් අය නොකෙරේ.

වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය තුල පහත දී ඇති වේගයෙන් ක්ෂය වීම සිදුවේ.

අයිතමය	වතුයායන්	ප්‍රධාන ශාඛාව
ගොඩනැගිලි	5%	5%
යන්ත්‍රෝපකරණ ආම්පන්න (පැරණි)	33.33%	12.5%
යන්ත්‍රෝපකරණ ආම්පන්න (නව)	20%	20%
නල පද්ධති හා වැසිකිලි	5%	5%
මෝටර් වාහන	25%	25%
ලී බඩු හා උපකරණ	12.5%	12.5%
මේරු වගාව	5%	5%
මාර්ග සහ පාලම්	5%	5%
ජල විදුලි බලාගාර	5%	5%
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර (නව)	20%	20%
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	12.5%	12.5%

4.2.4 පරිගණක මෘදුකාංග

ආශ්‍රිත දෘඩාංග සමග අභ්‍යන්තරව සම්බන්ධ නොවන පැහැදිලිව හඳුනාගත හැකි, විශ්වාසනීයව මැනිය හැකි සහ අනාගත ආර්ථික ප්‍රතිලාභ සඳහා හේතුවන සියළුම පරිගණක මෘදුකාංග, අස්පෘශ්‍යය වත්කම් කාණ්ඩය යටතේ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් කර ඇත.

4.2.5 ස්ථිර ඉඩම් සංවර්ධන පිරිවැය

ස්ථිර ඉඩම් සංවර්ධන පිරිවැය යනු නව ප්‍රවේශ මාර්ග සහ අනෙකුත් ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ඉඩම් සමෝච්චයන්හි විශාල වෙනස්කම් සිදුකිරීමට දරණ ලද පිරිවැයයි. මණ්ඩලයේ ක්ෂය වීමේ ප්‍රතිපත්තියට අනුව මෙම වර්ගයේ ව්‍යාපෘති (මාර්ග, පාලම් ආදිය) සඳහා වන පිරිවැය ප්‍රාග්ධනීකරණය හා ක්ෂය කිරීම සිදුකරනු ලැබේ.

4.2.6 ආයෝජන දේපල (කුලියට ගත් ඉඩම් හා ගොඩනැගිලි)

ආයෝජන දේපල නිසි ලෙස රඳවා තබාගෙන ඇත්තේ කුලි ආදායම් උපයා ගැනීම සඳහා හෝ ප්‍රාග්ධන ඇගයීම් සඳහා හෝ එම දෙකම සඳහා මිස සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීම් සඳහා හෝ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හෝ සැපයුම් හෝ පරිපාලනමය අරමුණු සඳහා නොවේ. ආයෝජන දේපල මනිනු ලබන්නේ මූලික පිළිගැනීම් මත පිරිවැය අනුව වන අතර පසුව සිදුවන ඕනෑම වෙනසක් සාධාරණ වටිනාකම්වල යුත් ලාභයක්/අලාභයක් ලෙස හඳුනාගත හැකිය.

ආයෝජන දේපල බැහැර කිරීමෙන් ලැබෙන ලාභයක්/අලාභයක් (ගණනය කරනු ලබන්නේ බැහැර කිරීමෙන් ලැබෙන ආදායම් හා අයිතමවල වටිනාකම් අතර වෙනසිනි) ලාභ අලාභ ප්‍රකාශයෙන් හඳුනා ගත හැකිය. පෙර දේපලක්, යන්ත්‍රෝපකරනයක් හෝ ආම්පන්නයක් ලෙස වර්ගීකරණය කර තිබූ ආයෝජන දේපලක් විකුණූ විට නැවත තක්සේරු කිරීමේ සංචිතයට ඇතුලත් කර ඇති ඕනෑම මුදලක් රඳවාගත් ඉපයීම් වෙත මාරු කරනු ලැබේ.

4.2.7 සීමිත ජීවිත ඉඩම් සංවර්ධන වියදම් නොමේරූ සහ මේරූ වගාවන්

නැවත සිටුවීම සහ අළුතින් සිටුවීම සඳහා සෘජුවම ආරෝපණය වන පිරිවැය අස්වැන්න නෙලන කාලය තෙක් නොමේරූ වගාවන් යටතේ වර්ගීකරණය කර ඇත. වෙළඳපල විසින් තීරණය කරන ලද මිල ගණන් හෝ අගයන් නොමැති නිසා සහ සාධාරණ වටිනාකම පිළිබඳ විකල්ප ඇස්තමේන්තු පැහැදිලිව විශ්වාස කල නොහැකි යයි තීරණය කර ඇති නිසා මන්ඩලය විසින් තේ. රබර්, කටු පොල් වැනි ජීව විද්‍යාත්මක වත්කම්වල නොමේරූ හා පරිනත වගාවන් එහි පිරිවැය යටතේ ගනනය කරනු ලබන අතර LKAS 16 යටතේ අර්ථදක්වා ඇති දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න යටතේ ඇති ජීව විද්‍යාත්මක වත්කම්වල ක්ෂය වීම් හා මූලික හඳුනාගැනීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය සපයා ඇති තින්දුවලට අනුකූලව සිදු කරයි.

සාධාරණ වටිනාකම පහසුවෙන් තීරණය කල නොහැකි බැවින් තවාන් පිරිවැය යටතේ පවත්වා ගනු ලැබේ. පිරිවැය, සෘජු ද්‍රව්‍ය, සෘජු සේවකයින් හා සෘජුවම බලපාන හේතුවල සුදුසු අනුපාත වලින් සමන්විත වේ. එවැනි ජීව විද්‍යාත්මක වත්කමක සාධාරණ වටිනාකම විශ්වාසනීයව මැනිය හැකි වූ විට එම අගයෙන් විකිණීම සඳහා වැයවන මුදල අඩු කල විට ලැබෙන අගය මණ්ඩලය විසින් ගණනය කරයි.

ඉඩම් සැකසිම, වගා කිරිම හා භෝග මෝරන තුරු හෝ අස්වැන්න ලබාගන්නා තෙක් සංවර්ධනය කිරිම සඳහා දැරිය යුතු වන සියළු වියදම් ජීව විද්‍යාත්මක වත්කම් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. බෝග මේරීමෙන් පසු දැරිමට සිදුවන සියළු වියදම් ලාභ/අලාභ ප්‍රකාශනයේ සෘජුවම හඳුනාගෙන ඇත. නැවත වගා කිරිම හා නව වගාවන් සඳහා අය කෙරෙන පොදු ගාස්තු වෙන් කරනු ලබන්නේ අදාල නැවත වගා කිරිම සහ නව වගාවන් සඳහා වැය කරන ලද ශ්‍රම දින ගණන පදනම් කරගෙන වන අතර ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ නොමේරූ ප්‍රදේශ පදනම් කරගෙනය. පොදු වියදම්වල ඉතිරි කොටස ගණනයන් සිදුකරනු ලබන කාල සිමාවට අදාල වියදම් වේ.

	නොමේරූ අවධිය	අස්වනු නෙලීම ආරම්භය
තේ	වසර 1 – 4	5 වන වසර
රබර්	වසර 1 – 6	7 වන වසර

4.2.8 බිම් පිරවීම සඳහා වියදම්

පෙරදි සිදුකරන ලද බිම් පිරවුම් කාරය සාධක ඇගයීමට වඩා අපේක්ෂිත අනාගත වාසිදායක තත්වයන් වැඩි, මේරූ ක්ෂේත්‍ර සඳහා බිම් පිරවුම් ලෙස භූමිය සංවර්ධනය වැය වන මුදල් ප්‍රාග්ධනීකරණය කරනු ලබයි. අදාල මේරූ වතුයායේ ප්‍රයෝජනවත් ආර්ථිකයක් ඉතිරිව පවතින නව වත්කම් හෝ අපේක්ෂිත බදු කාලය අඩු නම් පිරවුම් වියදම් ක්ෂය වේ.

පිරවුන් වියදම් ප්‍රාග්ධනීකරණය කර නොමැති නම් ඒවා සිදු කල වසරේ ආදායම් ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ.

දැව වගාව

මූලික හඳුනාගැනීමේදි දැව වගාව සාධාරණ අගයකින් ගණනය කර ඇති අතර සහ සෑම වාර්තාකරණ කාල සිමාවක් අවසානයේදිම විකිණිම සඳහා වන වියදම් එනම් ප්‍රවාහනය ඇතුළු විකිණීමට අවශ්‍ය වන වියදම් සියල්ල අන්තර්ගත මුළු වියදම එම සාධාරණ අගයෙන් අඩු කරනු ලැබේ.

සාධාරණ වටිනාකමක් ඇති දැව වගාවන් විකිණීම සඳහා අඩු පිරිවැයක් දැරීම සහ සාධාරණ වටිනාකම් වෙනස්වීමෙන් එක් එක් වාර්තාකරණ දිනයේදී වැවිලි සඳහා අඩුවන පිරිවැය ඒවා පැන නගින කාල සීමාව සඳහා ලාභාලාභ ප්‍රකාශයට ඇතුලත් වේ. වත්කම් පවත්වාගෙනයාම සඳහා දැරීමට සිදුවන සියළු වියදම් එම අදාල වර්ෂයේ ලාභාලාභ ප්‍රකාශයට ඇතුලත් වේ.

ජීව විද්‍යාත්මක වත්කම්

මණ්ඩලය විසින් වත්කම අතීත කටයුත්තක ප්‍රතිඵලයක් ලෙස පාලනය කරයි නම් ජීව විද්‍යාත්මක වත්කම් පිළිගැනීම සඳහා සුදුසුකම් ලබයි. වත්කම් හා බැදුනු අනාගත ආර්ථික ලාභයන් මණ්ඩලය වෙත ගලා එන අතර සාධාරණ අගය හෝ වත්කමේ වියදම නිරවද්‍ය ලෙස ගණනය කල හැකි වේ.

4.2.9 භාණ්ඩ ලේඛනය

යල් පැනගිය සහ අඩුවෙන් විකිණෙන භාණ්ඩ සඳහා නිසි දීමනා ලබාදීමෙන් පසු නිෂ්පාදන තොග සහ තවාන් හැර අනෙකුත් භාණ්ඩ වියදම් අඩු සහ ශුද්ධ අගයන් ඇති භාණ්ඩ ලෙස සඳහන් වේ. භාණ්ඩ ලේඛන සඳහා වියදම් නියම කිරීමේදි මණ්ඩලය විසින් FIFO ක්‍රමවේදය යොදා ගනියි. මෙම වියදම් සඳහා කොටස් ලබාගැනීම, නිෂ්පාදනය සහ පරිවර්තන වියදම් සහ පවතින ස්ථානයට සහ තත්වයට ළඟා කරගැනීමට දැරිය යුතු වූ වියදම් ආදිය අන්තර්ගත වේ. ශුද්ධ වටිනාකම ලෙස අදහස් වන්නේ තක්සේරුකරන ලද වටිනාකමෙන් භාණ්ඩය සම්පූර්ණ කිරීමට තක්සේරු කරන ලද වියදම හා භාණ්ඩය විකිණීම සඳහා දැරීමට සිදුවන වියදම් ලෙස තක්සේරු කරන ලද වියදම් අඩුකල විට ලැබෙන අගයයි.

ශේෂ පත්‍රයේ සඳහන් දිනය තෙක් නිපදවන ලද භාණ්ඩවල වටිනාකම අධිගත් අගය අනුව ගණනය කරන ලදී. ඉතිරි තොගයේ වටිනාකම තක්සේරුගත විකුණුම් මිල අනුව ගණනය කරන ලදී. මෙම අගයෙන් ප්‍රසිද්ධ වෙන්දේසිය සඳහා වියදම් වන සියළු මුදල් අඩු කල විට ලැබෙන ශුද්ද අගය වේ.

තේ කිලෝ ග්‍රෑම් 1ක නිෂ්පාදන පිරිවැය සෑමවිටම ගණනය කල ශුද්ධ අගයට වඩා ඉහළ වේ.

මූල්‍යමය වත්කම්

LKAS 39 විෂය පථය තුල ඇති මූලික හඳුනාගැනීම සහ මූල්‍ය වත්කම් මැනීම ලාභ හෝ අලාභ, ණය හා ලැබිය යුතු මුදල්, කල් පිරිම සඳහා තබා ඇති ආයෝජන. විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් හෝ කොටුකිරීමේ උපකරණ ලෙස නිමිති කල දේ මූල්‍ය වමත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. මූල්‍ය වත්කම් මූලික හඳුනාගැනීමේදි මණ්ඩලය විසින් එහි වර්ගීකරණය සිදුකරනු ලැබේ.

සියළු මූල්‍ය වත්කම් මුලින් සාධාරණ වටිනාකමකින් හඳුනාගෙන ඇති අතර ලාභය හෝ අලාභය ලෙස සාධාරණ වටිනාකමක් නොමැති වත්කම් සඳහා ගණුදෙනු පිරිවැය යොදා ගනියි. වෙළඳපලේ (සාමාන්‍ය වෙළඳාම්) රෙගුලාසි හෝ ගිවිසුම් අනුව ස්ථාපිත කරන ලද කාල රාමුවක් තුල බෙදා හැරීම අවශ්‍ය වන මූල්‍ය වත්කම් හඳුනාගැනීම, මිලදී ගැනීම හෝ විකිණීම වෙළඳාම් කරන ලද දිනයේදී එනම් මණ්ඩලය විසින් වත්කම මිළදී ගැනීම හෝ විකිණීම සිදුකිරීමට පවරන දිනයේදී සිදුකල යුතුය. මණ්ඩලයේ මූල්‍ය වත්කම්වලට මුදල් හෝ මුදල් වලට සමාන දේ, කෙටිකාලීන තැන්පතු, ණය සහ සැපයුම්කරුවන්ට දෙන ලද අත්තිකාරම්, විකුණුම් සහ අනෙකුත් ලැබිය යුතු ආදායම් අයත් වේ.

පසුව සිදුකරන ගණනය කිරීම

මූල්‍ය වත්කම්වල පසුව සිදුකරන ලද ගණනය කිරීම් පහත විස්තර කර ඇති පරිදි වර්ගීකරණය කරනු ලැබේ. ලාභය හා අලාභය තුලින් සාධාරණ වටිනාකමක් ඇති මූල්‍ය වත්කම්වලට වෙළඳාම සඳහා ඇති මූල්‍ය වත්කම් සහ ලාභ හා අලාභ හරහා සාධාරණ වටිනාකමකින් මූලික පිළිගැනීම මත නම් කරන ලද මූල්‍ය වත්කම් ඇතුලත් වේ. මූල්‍ය වත්කම් නුදුරු කාලීනව විකිණීම හෝ මිළදී ගැනීම සඳහා අත්පත් කර ගනු ලැබුවහොත් ඒවා වෙළඳාම සඳහා තබා ඇති ලෙසට වර්ගීකරණය කර ඇත. LKAS 39 මගින් අර්ථ දක්වා ඇති පරිදි ඉදිරියේදි ආරක්ෂා විමේදි ඇතිවන සම්බන්ධතාවල ආරක්ෂිත උපකරණ ලෙස නම් කර නොමැති මණ්ඩලය විසින් ඇතුලත් කර ඇති ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ මෙම කාණ්ඩයට ඇතුලත් වේ. වෙන්කල, කාවැද්දූ ව්‍යුත්පන්නයන් ඇතුළු ව්‍යුත්පන්නයන් ඵලදායී ඉදිරි ආරක්ෂක උපකරණ ලෙස නම් නොකලහොත් වෙළඳාම සඳහා රඳවා ඇති ඒවා ලෙස වර්ගීකරනය කර ඇත. සාධාරණ අගයක් සහිත මූල්‍ය වත්කම් මූල්‍ය තත්වය දක්වන ප්‍රකාශයේ ලාභ හෝ අලාභ ලෙස දක්වා ඇත. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් හෝ මූල්‍ය වියදම් ලෙස සාධාරණ අගයේ සිදුවූ වෙනස්කම් දක්වා ඇත. මූල්‍ය වත්කම් නුදුරු කාලයේදි විකිණීම සුදුසුදැයි පරීක්ෂා කිරීම සඳහා මණ්ඩලය විසින් මූල්‍ය වත්කම් සාධාරණ අගයක් මත ලාභ හා අලාභය මගින් ඇගයීමක් කරන ලදී. අක්‍රිය වෙළඳපලවල් නිසා මණ්ඩලයට මෙම මූල්‍ය වත්කම් විකිණීමට නොහැකි වූ නිසා ඒවා අනාගතයේදි විකිණීමට කළමනාකාරිත්වය අරමුණු කරගෙන ඇත.

සැලකිය යුතු ලෙස වෙනස් වූ විට මෙම මූල්‍ය වත්කම් දුර්ලභ අවස්ථාවන්හි වර්ගීකරණය කිරීමට මණ්ඩලය තෝරාගත හැකිය. ණය සහ අනෙකුත් ලැබිය යුතු දේ වර්ගීකරණය කිරීම, විකිණීම හෝ කල් පිරෙන තෙක් තබාගැනීම වත්කම්වල ස්වභාවය මත රදා පවතියි.

ලාභය හෝ අලාභය තුලින් සාධාරණ වටිනාකමක් සහිත මූල්‍ය වත්කම්

විකිණීම සඳහා තබා ඇති මූල්‍ය වත්කම් සහ ලාභය හෝ අලාභය මගින් සාධාරණ අගයක් සහිත ලෙස මූලිකව හඳුනාගෙන ඇති මූල්‍ය වත්කම්, ලාභය හෝ අලාභය තුලින් සාධාරණ වටිනාකමක් සහිත මූල්‍ය වත්කම්වලට අන්තර්ගත වේ. විකිණීමේදි හෝ නුදුරු කාලයේදි නැවත මිලදි ගැනීමේ අරමුණකින් තබා ගත් මූල්‍ය වත්කම්, විකිණීම සඳහා තබා ඇති දේ ලෙස වර්ගීකරණය කර ඇත. LKAS 39 හි අර්ථ දක්වා ඇති පරිදි මෙම කාණ්ඩයට ඉදිරි රැකුම් සම්බන්ධතාවල රැකුම් උපකරණ ලෙස නම් කර නොමැති මණ්ඩලය විසින් ඇතුලත් කරන ලද ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ ඇතුලත් වේ. වෙනම පවතින ව්‍යුත්පන්න ඇතුළු ව්‍යුත්පන්න ඉදිරි රැකුම් උපකරණ ලෙස නම් කර නොමැති නම් විකිණීම සඳහා පවතින ලෙස වර්ගීකරණය කර ඇත. සාධාරණ අගයන් සහිත මූල්‍ය වත්කම් මූල්‍ය තත්වය දක්වන ප්‍රකාශයේ ලාභ හෝ අලාභ ලෙස දක්වා ඇත. ආදායම් ප්‍රකාශයේ මූලය ආදායම් හෝ මූල්‍ය වියදම් ලෙස සාධාරණ අගයේ සිදු වූ වෙනසක් දක්වා ඇත.

මූල්‍ය වත්කම් නුදුරු කාලයේදි විකිණීම සුදුසුදැයි පරීක්ෂා කිරීම සඳහා මණ්ඩලය විසින් මූල්‍ය වත්කම් සාධාරණ අගයක් මත ලාභය හෝ අලාභය මගින් ඇගයීමක් කරන ලදි. අක්‍රිය වෙළඳපලවල් නිසා මණ්ඩලයට මෙම මූල්‍ය වත්කම් විකිණීමට නොහැකි වූ නිසා ඒවා අනාගතයේදි විකිණීමට මණ්ඩලය අරමුණු කරගෙන ඇත.

සැලකිය යුතු වෙනස්වූ විට මෙම මූල්‍ය වත්කම් දුර්ලභ අවස්ථාවන්හි වර්ගීකරණය කිරීමට මණ්ඩලය තෝරාගත හැකිය. ණය සහ අනෙකුත් ලැබිය යුතු දේ වර්ගීකරණය කිරීම, විකිණීම හෝ කල් පිරෙන තෙක් තබාගැනීම වත්කම්වල ස්වභාවය මත රඳා පවතී.

ණය සහ ලැබිය යුතු දේ

ණය සහ ලැබිය යුතු දේ යනු ක්‍රියාකාරී වෙළඳපලක සඳහන් නොවන ස්ථාවර හෝ තීරණය කල හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික ගණනය කිරීම් වලින් අනතුරුව, එවැනි මූල්‍ය වත්කම් අඩු අපහායනය සහිත කාර්යක්ෂම පොලී අනුපාත ක්‍රමයක් යටතේ (EIR) ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කරගැනිම සඳහා වන ඕනෑම වට්ටමක් හෝ වාරිකයක් සහ EIR හි අනිවාර්ය අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි. EIR ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් යටතේ අන්තර්ගත කර ඇත.

විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන

විකිණීම සඳහා ලබාගත හැකි මූල්‍ය වත්කම් යනු ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර ඒවා විකිණීම සඳහා ලබාදී ඇති පරිදි නම් කර ඇති අතර ඉහත සඳහන් මූල්‍ය වත්කම් වර්ගීකරණයෙන් වර්ගීකරණය කර නොමැත.

විකිණීම සඳහා ලබාගත හැකි මූල්‍ය වත්කම් මුලින් සාධාරණ වටිනාකමකින් සහ ඍජුවම ආරෝපණය කල හැකි ගනුදෙනු පිරිවැයකින් හඳුනා ගැනේ. මූලික හඳුනාගැනිමකින් අනතුරුව ඒවා මනිනු ලබන්නේ හානිකර පාඩු සහ පවතින ණය උපකරණවල විදේහ මුදල් වෙනස හැරුණු විට සාධාරණ වටිනාකම් සහ ගාස්තු අනුව වන අතර වෙනත් පුළුල් ආදායමකින් හඳුනාගෙන සාධාරණ කොටස් සංචිතයේ සාධාරණ ලෙස ඉදිරිපත් කරනු ලැබේ. ආයෝජනයක් හඳුනා නොගත් විට කොටස්වල එකතු වී ඇති ලාභය හෝ අලාභය, ලාභ හෝ අලාභ ලෙස නැවත වර්ගීකරණය කෙරේ. විකිණීමට තිබෙන මූල්‍ය වත්කම්, කොටස් සුරැකුම්පත් වලින් සමන්විත වේ.

පිළි නොගැනීම

මූල්‍ය වත්කමක් (හෝ අදාල ස්ථානවලදී මූල්‍ය වත්කමෙන් කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සහිත මණ්ඩලයකින් කොටසක්) පිළිනොගැනීම සිදුවන්නේ එම වත්කමින් මුදල් ඉපයීමේ අයිතිය කල් ඉකුත් වූ විටය. වත්කම මගින් ලැබෙන මුදල් ලබාගැනීමේ අයිතිය මණ්ඩලය විසින් පවරා දි ඇත. නැතහොත් කිසියම් විධිවිධානයක් හරහා තෙවන පාර්ශවයකට ද්‍රව්‍යමය ප්‍රමාදයකින් තොරව ලැබුණු මුදල් ප්‍රවාහයන් සම්පූර්ණ ගෙවීමට බැදි සිටියි. මණ්ඩලය විසින් (a) වත්කකම්වල සියළු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර ඇති හෝ (b) වත්කම්වල සියළු අවදානම් සහ ප්‍රතිලාභ මාරු කිරීම හෝ රඳවා තබාගැනීම සිදුකර නොමැති නමුත් වත්කම් පාලනය කිරීම පවරා ඇත.

වත්කමකින් මුදල් ප්‍රවාහ ලබාගැනීම සඳහා මණ්ඩලය සිය අයිතිවාසිකම් මාරු කර ඇති විට හෝ විධිවිධානයක් හරහා ගමන් කර ඇති විට සහ වත්කම්වල සියළු අවධානම් සහ විපාක සැලකිය යුතු ලෙස මාරු කර හෝ රඳවාගෙන
නොමැති විට සහ එහි පාලනය මාරු කර නොමැති විට මණ්ඩලය විසින් එයට අඛණ්ඩව සම්බන්ධ වන තරමට එම වත්කම් හඳුනාගැනීම සිදුවේ.

එවැනි අවස්ථාවක මණ්ඩලය විසින් හවුල් වගකීමක් හඳුනා ගනියි. පැවරූ වත්කම හා හවුල් වගකීම ගණනය කිරීම මණ්ඩලය රඳවාගත් අයිතිවාසිකම් හා බන්ධනය මගින් පිළිඹිබු වේ.

මූල්‍ය වත්කම් අපහායනය

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් මණ්ඩලයක් අපහායනය වූවාදැයි පරීක්ෂා කිරීමට මණ්ඩලය විසින් සෑම වාර්තාකරණ දිනයකදීම ඇගයීමක් සිදු කරනු ලබයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් මණ්ඩලයක් දුර්වල යැයි සලකනු ලබන්නේ වත්කම මුලින් හඳුනාගැනීමෙන් පසුව සිදුවන සිදුවීම් එකක් හෝ වැඩි ගනනක ප්‍රතිඵානියන් ලෙස හානියක් සිදුවූ බවට වෛෂයික සාක්ෂි තිබේ නම් සහ එම මූල්‍ය වත්කමට හෝ මූල්‍ය වත්කම් මණ්ඩලයේ අනාගත මුදල් ලැබීම්වලට තක්සේරු කල හැකි බලපෑමක් සිදුවන්නේ නම් පමණි.

හානිය පිළිබඳ සාක්ෂිවලට සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා අත්දකින ණයගැතියන් හෝ ණය මණ්ඩලයක් ඇති බවට සාක්ෂි, පොලී හෝ මූලික ගෙවීම පැහැර හැරීම හෝ අඩුපාඩුකම්, ඔවුන් බංකොලොත්භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට සහ අනාගත මුදල් ලැබීම් මැනිය හැකි ලෙස අඩුවිය හැක. එනම් හිඟ මුදල්වල වෙනස්කම් හෝ සම්බන්ද වන ආර්ථික තත්වයන් අන්තර්ගත විය හැකිය.

මූල්‍ය වගකීම්

මූලික හඳුනාගැනීම සහ මිනුම්

LKAS 39 වපසරිය තුල පවතින මූල්‍ය වගකීම් යෝග්‍ය ලෙස ලාභ හෝ අලාභ ලෙස සාධාරණ අගයන් සහිත මූල්‍ය වගකිම්, ණය හා ණයට ගැනීම්, ඵලදායී රකුමක රැකුම් උපකරණයක් ලෙස නම් කරන ලද ව්‍යුත්පන්න ලෙස වර්ගීකරණය කල හැකිය. මූලික හඳුනාගැනිමේදි මණ්ඩලය විසින් අදාල මූලික වගකිමේ වර්ගිකරණය හඳුනාගනියි.

සියළු මූල්‍ය වගකීම් මූලිකව සාධාරණ අගයකින් හඳුනාගන්නා අතර ණය හෝ ණයට ගැනීම් සැලකිමේදි ක්‍රමක්ෂය පිරිවැය සලකයි. මේ සඳහා සෘජුවම ආරෝපණය කල හැකි ගණුදෙනු පිරිවැය අන්තර්ගත වේ. මණ්ඩලයේ මූල්‍ය වගකීම්වලට වෙළදාම් හා අනෙකුත් ගෙවිය යුතු දේ, බැංකු අයිරා සහ ණයට ගැනීම් අන්තර්ගත වේ.

පසුව සිදුකරන ගණනය කිරීම්

මූල්‍ය වත්කම මැනිම ඔවුන්ගේ පහත වර්ගිකරණය මත තීරණය වේ.

ලාභ/අලාභ ලෙස සාධාරණ අගයක් සහිත මූල්‍ය වගකීම්

ලාභ/අලාභ ලෙස සාධාරණ අගයක් සහිත මූල්‍ය වගකීම්වලට වෙළඳ කටයුතු සඳහා පවතින මූල්‍ය වගකීම් හා ලාභ/අලාභ ලෙස සාධාරණ අගයකින් මූලික හඳුනාගැනීමේදිම හඳුනාගත් මූල්‍ය වගකිම් ඇතුලත් වේ.

මූල්‍ය වගකිම් වෙළඳ කටයුතු සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කර ඇත්තේ ඒවා නුදුරු අනාගතයේදි විකිණීමේ අරමුණ ඇතිව ලබාගත්තේ නම්ය. LKAS 39 ට අනුව රැකුම් සබඳතාවල රැකුම් උපකරණ ලෙස හඳුනාගෙන නොමැති මණ්ඩලය මගින් ඇතුළු වූ ව්‍යුත්පන්න මූල්‍ය වගකීම් මෙයට ඇතුලත් වේ. වෙන්කල කාවැද්දූ ව්‍යුත්පන්න ඵලදායී රැකුම් උපකරණ ලෙස හඳුනාගෙන නොමැති නම් ඒවාද වෙළඳ කටයුතු සඳහා තබා ඇති ලෙස වර්ගිකරණය කරයි. වෙලඳ කටයුතු සඳහා ගෙන ඇති වගකීම්වල ලැබීම් හා වියදම්වීම් ලාභ හා අලාභ තුලින් හඳුනා ගනියි. මූලික හඳුනාගැනිම තුල ලාභ/අලාභ ලෙස සාධාරණ අගයක් ඇති මූල්‍ය වගකීම් මණ්ඩලය විසින් හඳුනාගෙන නොමැත.

ණය සහ ණයට ගැනීම්

මූලික හදුනාගැනීමෙන් අනතුරුව ඵලදායී පොලි අනුපාත ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය මත පොලි දරණ නය සහ ණයට ගැනිම් පසුව මැනිම සිදුකරයි. වගකිම් හදුනා නොගත් විට ආදායම් ප්‍රකාශයෙන්ද ක්‍රමක්ෂය ක්‍රියාවලියේ ඵලදායී පොලී අනුපාත ක්‍රමයෙන්ද (EIR) ලැබීම් හා වියදම් හදුනාගනියි. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ අත්පත් කරගැනීම සහ ගාස්තු හෝ පිරිවැය පිළිබද කිසියම් වට්ටමක් හෝ වාරිකයක් සැලකිල්ලට ගෙන වන අතර එය ඵලදායී පොලි අනුපාත ක්‍රමයේ අනිවාර්ය අංගයකි. ඵලදායී පොලි අනුපාත ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය වියදම් වල අන්තර්ගත කර ඇත.

හදුනා නොගැනීම

වගකිම යටතේ ඇති බැදිම නිදහස් කල විට, අවලංගු කලවිට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකිමක් හදුනා නොගැනිම සිදුවේ. පවත්නා මූල්‍ය වගකිමක් එකම ණය දෙන්නා ගෙන් වෙනත් අයෙකු විසින් සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත ප්‍රතිස්තාපනය කල විට හෝ පවත්නා වගකිම් පිලිබද කොන්දේසි සැලකිය යුතු ලෙස වෙනස් කල විට එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරිමක් සලකනු ලැබේ.

මුල් වගකීම හදුනා නොගැනිම සහ නව වගකීමක් හදුනාගැනිම සහ අදාල රැගෙන යන ප්‍රමානයන්හි වෙනස ආදායම් ප්‍රකාශයේ හදුනාගෙන ඇත.

මූල්‍ය උපකරණ හිලවු කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් මූලය තත්ව ප්‍රකාහයේ වාර්තා කර ඇති ශුද්ද මුදල හිලවු වන්නේ පිලිගත් මුදල් පියවා ගැනීමට, ශුද්ධ පදනම් මත පියවීමට හෝ වත්කම් සාක්ෂාත් කරගැනීමට හෝ වත්කම් එකවර පියවීමට වර්තමාන බලාත්මක කල හැකි නිතිමය අයිතියක් තිබේ නම් පමණි. මණ්ඩලයේ ගිණුම් පිළිවෙත්වල විශේෂයෙන් සඳහන් කර ඇති පරිදි කිසියම් ගිණුම් සම්මතයක් හෝ අර්ථ නිරූපනයක් සඳහා අවශ්‍ය වන හෝ අනුමැතිය ලබාදි හෝ නොමැති නම් ආදායම් ප්‍රකාශය තුල ආදායම් හා වියදම් හිලව් නොකරනු ඇත.

මූල්‍ය උපකරණවල සාධාරණ අගය

සෑම වාර්තා කරන දිනයකදීම ක්‍රියාකාරී වෙළඳපල තුල වෙළදාම් කල මූල්‍ය උපකරණවල සාධාරණ අගය, ගණුදෙනුව සඳහා වන කිසිදු වියදමක් අඩු නොකර උපුටා ගත් වෙළඳපල මිල හෝ බෙදා හරින්නාගේ මිල ගණන් (දිගු කාලිනව ලන්සු තබා කෙටි කාලින මිල විමසීම) අනුව හදුනා ගනියි. ක්‍රියාකාරී වෙළඳපල තුල වෙළදාම් සිදු නොවන මූල්‍ය උපකරණවල සාධාරණ මිල යෝග්‍ය තක්සේරු ක්‍රමවේද අනුව හදුනා ගනියි.

එවැනි ක්‍රමවේද සඳහා මෑත කාලයේ වෙළඳපල ගණුදෙනු ලබාගැනීම, මෙයට සමාන වෙනත් මූල්‍ය උපකරණයක සාදාරණ අගය ගැනීම, වට්ටම් සහිත මුදල් ගැලුම් සමාලෝචනය හෝ අනෙකුත් තක්සේරු කරන ක්‍රමවේද ආදිය අන්තර්ගත වේ.

ප්‍රතිපාදන, අවිනිශ්චිත වගකීම්, අවිනිශ්චිත වත්කම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට, වර්තමාන වගකිමක් (නෛතික හෝ ඉදිකිරිම්) ඇතිවිට සහ සම්පත් පිටතට ගලායාම මගින් ආර්ථික වාසි ඇතිවන බවට අනුමාන කල හැකිවිට වගකිම් පියවිය යුතු අතර වගකිම් ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් කල හැකිය.

සම්පත් පිටතට ගලායාම විදුර නොවේ නම් සියව අවිනිශ්චිත වගකීම් මූල්‍ය ප්‍රකාශනවල සටහනක් ලෙස අනාවරණය වේ. ආර්ථික ලාභ ලැබීමක් සිදුවිය හැකි නම් අවිනිශ්චිත වත්කම් අනාවරණය වේ.

4.2.10 වෙළඳාම් සහ අනෙකුත් ලැබීම්

ළඟා කරගැනීමට ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයන් සහ අයහපත් සහ සැක සහිත ණය සඳහා ශුද්ධ ප්‍රතිපාදන අගයන් අනුව වෙළඳාමෙන් ලැබිය යුතු දේ සඳහන් කර ඇත.

4.2.11 මුදල් හෝ මුදල් වලට සමාන දේ

මුදල් හෝ මුදල්වලට සමාන දෑ මුදල් ශේෂයන්. ස්ථිර තැන්පතු සහ ඇරයුම් තැන්පතු වලින් සමන්විත වේ. ඉල්ලුම අනුව නැවත ගෙවිය යුතු සහ මණ්ඩලයේ මූල්‍ය කළමනාකරණයේ අනිවාර්ය අංගයක් වන බැංකු අයිරා මුදල් ප්‍රවාහයන්වල අරමුණක් ලෙස මුදල් හෝ මුදල්වලට සමාන දේ වලට අන්තර්ගත කර ඇත.

වක්‍රාකාර ක්‍රමයක් මත පදනම්ව සකස් කරන ලද මුදල් ගැලීමේ ප්‍රකාශයේ නිරූපණය කිරීම සඳහා ගෙවන ලද පොලිය මෙහෙයුම් මුදල් ගැලිමක් ලෙසත් ලැබුණු පොලිය ආයෝජන මුදල් ගැලිමක් ලෙසත් වර්ගීකරණය කර ඇත.

4.9 වගකීම් සහ ප්‍රතිපාදන

5.1 සේවකයින්ගේ විශ්‍රාමික වරප්‍රසාද

(a) පවතින වරප්‍රසාද සැලසුම්

සුදුසුකම් සපුරා ඇති සේවකයින්ට 1983 අංක 13 දරණ පාරිතෝෂික ගෙවීම් පනත සහ 1978 අංක 34 දරණ ඉන්දියානු දේශප්‍රත්‍යාවර්තක පනතට අනුව විශ්‍රාමික වරප්‍රසාද සැලැස්මක් සකස් කර ඇත. විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය මත LKAS 19 ට අනුකූලව සියළුම සේවකයින් සඳහා සේවයේ පළමු වසරේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබාදී නොමැත. කෙසේවෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික පනතට අනුව සේවකයින් සඳහා ගෙවීමේ වගකීම අඛණ්ඩ පස් අවුරුදු සේවා කාලයකට පසුව මතුවේ. මූල්‍ය ප්‍රකාශනවලට ඇති සටහන්වල වගකීම් අන්තර්ගත කර ඇත.

(b) පැරණි සේවකයින්ට ගෙවිය යුතු පාරිතෝෂික

2021 දෙසැම්බර් 31 දිනට වතුයායේ සේවකයින්ට ගෙවිය යුතු පාරිතෝෂික දිමනා නිවැරදිව ගණනය කර වතුයායේ ගිණුම්වල ඇතුලත් කර ඇත. පැරණි සේවකයින් සඳහා ගෙවිය යුතු මුදල් 2021 දෙසැම්බර් වන විට රු.818,445,431.36 ක් වේ.

(c) පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

විශ්‍රාමික පාරිතෝෂික සඳහා සියළු සේවකයින්ගේ සේවයේ පළමු වසරේ සිට ප්‍රතිපාදන වෙන් කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර ඇත. පාරිතෝෂික වලට අදාලව ශේෂ පත්‍රයේ හඳුනා ගත් වගකීම් යනු වාර්තා කරන කාල සීමාව අවසන් වූ විට බැඳීමේ වර්තමාන වටිනාකම වේ. මණ්ඩලය විසින් බොහෝ කාලයකින් ආයු ගණන තක්සේරුවක් සිදු කර නොමැත.

(d) නිශ්චිත දායකත්ව සැලසුම් (EPF, ETF, ESPS, CPPS)

නිශ්චිත අර්ථසාධක අරමුදලට සහ සේවක විශ්වාසී අරමුදලට සුදුසුකම් ලබා ඇති සියළු සේවකයින් අදාල ප්‍රතිපත්ති සහ රෙගුලාසිවලට අනුකූලව අදාල දායක අරමුදල් මගින් ආවරණය කෙරේ. සේවකයින්ගේ දල වැටුප් අනුව 12% ක් EPF, ETF, ESPS, CPPS අරමුදල් සඳහාද 3% ක් ETF අරමුදල සඳහාද මණ්ඩලය විසින් ගෙවනු ලැබේ.

2000 සිට 2021 තෙක් නියම කරන ලද කාලය තුල EPF, ETF සහ ESPS, CPPS, EPF, ETF මණ්ඩලය වෙත ප්‍රේෂණය කර නොමැත. කම්කරු කොමසාරිස් විසින් අධ්‍යක්ෂ මණඩලයට එරෙහිව නිතිමය පියවර ගෙන ඇත.

2021.12.31 වන දිනට ශේෂයන්	
ගෙවිය යුතු EPF (2000 – 2021)	**රු.1,165,738,001.24**
ගෙවිය යුතු ETF (2000 – 2021)	**රු. 83,205,401.03**
ගෙවිය යුතු ESPS (2000 – 2021)	**රු. 131,793,854.39**
ගෙවිය යුතු CPPS (2000 – 2021)	**රු. 25,761,608.44**

5.3 රාජ්‍ය ප්‍රදානයන්

දේපලක්, යන්ත්‍රෝපකරණයක් හා ආම්පන්නයක් මිලදී ගැනීමට අදාල රාජ්‍ය ප්‍රදානයන් ගණනය කරනු ලබන්නේ පිරිවැයෙන් අපහායන හානිය අඩු කිරීමෙන් වන අතර ඒවා ලැබෙ යැයි සාධාරණ සහතිකයක් පවතින විට ඒවා මූලිකව හඳුනාගත් සාධාරණ අගයකින් යුක්ත විලම්බිත ආදායමක් ලෙස පිළිගැනේ. තවද මණ්ඩලය ප්‍රදාහය හා සම්බන්ද කොන්දේසි වලට අවනත වනු ඇති අතර අදාල වත්කම්වල අපේක්ෂිත ජීවිතවලට වඩා සරල රේඛීය පදනම මත ලාභ අලාභ ප්‍රකාශයෙන් හඳුනාගනු ලැබේ.

මණ්ඩල වියදම් හෝ දැනටමත් සිදුවී ඇති පාඩු සඳහා වන්දි ලබාදෙන ප්‍රදාන, ලැබිය යුතු කාල සීමාව සහ වියදම් හඳුනාගත් විට වෙනත් ආදායමක් ලෙස ලාභය හෝ අලාභය දක්වන ප්‍රකාශය මගින් හඳුනා ගැනේ.

වෙළඳ ගෙවීම්

වෙළඳ ගෙවීම් යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී සැපයුම්කරුවන් ගෙන් ලබාගත් භාණ්ඩ හෝ සේවා සඳහා ගෙවීමට බැදී සිටීමයි. ගෙවීම් වසරක් හෝ ඊට අඩු කාලයක් තුල ගෙවිය යුතු නම් ගෙවිය යුතු ගිණුම් වර්තමාන වගකීම් ලෙස වර්ගිකරණය කර ඇත. එසේ නොමැති නම් ඒවා වර්තමාන නොවන වගකීම් ලෙස ඉදිරිපත් කර ඇත. වෙළඳ ගෙවීම් මුලින් සාධාරණ වටිනාකමකින් හඳුනාගෙන පසුව එලදායී පොලී ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලැබේ.

බදුකරණය

වත්මන් බද්ද

බදු වියම් වත්මන් බදු වියදම් හා විලම්භිත බදු වලින් සමන්විත වේ. වර්තමාන සහ පෙර කාල පරිච්ඡේදයන් සඳහා පවත්නා ආදායම් බදු වත්කම් හා වගකීම් මනිනු ලබන්නේ බදු අයකර ගැනීමේ බලධාරීන්ගෙන් අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරන ප්‍රමාණය අනුවය. මුදල් ගණනය කිරීම් සඳහා භාවිතා කරන බදු අනුපාත සහ බදු නීති යනු ශේස පත්‍රයේ දිනය අනුව බලාත්මක කරන ලද හෝ සැලකිය යුතු ලෙස බලාත්මක කරන ලද ඒවාය. ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම් වී ඇත්තේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති පරිදි ආදායම් හා වියදම්වල අංගයක් මත වන අතර 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන හා ඒ සඳහා වන සංශෝධන අනුව ගණනය කෙරේ.

5.3 ආදායම් ප්‍රකාශය

ආදායම්

මණ්ඩලය වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට ඉඩ ඇතිතාක් දුරට ආදායම හඳුනා ගෙන ඇති අතර ගෙවීම සිදුකරන්නේ කුමන අවධියක වුවත් ආදායම පහසුවෙන් මැනිය හැකිය. භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම මනිනු ලබන්නේ ලැබුණු හෝ ලැබෙන දේවල සාධාරණ වටිනාකම්, ශුද්ධ ප්‍රතිලාභ හා දිමනා, වෙළඳ වට්ටම් හා පරිමා වට්ටම් මතය. සැලකිය යුතු අවධානම් හා ප්‍රතිලාභ ගැණුම්කරු වෙත මාරු කර ඇත්නම් සලකා බලන ලද අගය යථාර්ථයක් කර ගැනීමට හැකියාවක් පවතියි නම් ඒ හා සම්බන්ද පිරිවැය හා භාණ්ඩවල ප්‍රතිලාභ විශ්වාසදායක ලෙස තක්සේරු කල හැකි නම්, භාණ්ඩ සමග අඛණ්ඩ කළමනාකරණ මැදිහත්වීමක් නොමැති නම් හා ආදායම් ප්‍රමාණය විශ්වාසව මැනිය හැකිනම් ආදායම හඳුනගත හැකිය.

වාර්තා කරන දිනයේදි ගණුදෙනුව අවසන් කිරීමේ අදියරට සමානුපාතිකව ඉටුකරන ලද සේවාවන් ලෙන් ලැබෙන අදායම ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගැනේ. සිදුකරන ලද කාර්යයන් පිළිබද සමීක්ෂණය මගින් සම්පූර්ණ කිරීමේ අදියර තක්සේරු කරනු ලැබේ. අරමුණුවල හිමිකාරිත්වයේ සැලකිය යුතු අවධානම් සහ ප්‍රතිලාභ ආයතන විසින් මාරු කරන වෙලාව තීරණය කිරීම සඳහා මණ්ඩලය පහත සඳහන් ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන් අනුගමනය කර ඇත.

(a) වෙන්දේසියේදි තේ විකිණීම

ලංකා තේ වෙළඳුන්ගේ සංගමය (17 වන කොටස) විසින් නිකුත් කරන ලද තේවල නිති හා කොන්දේසි වලට අනුව වැඩිම ලන්සුකරු පිළිගනු ලබන අතර මිටිය පහලට වැටෙන අවස්ථාවේදි විකිණීම අවසන් කල යුතුය. විකිණීමේ වටිනාකම තීරණය කරනු ලබන්නේ එකඟ වූ මිල හා ප්‍රමාණය අනුව සහ විකුණුම් සටහන් ඉහලට එසවීමෙන් වේ.

(b) වෙන්දේසියේදී රබර් විකිණීම

කොළඹ රබර් වෙළඳුන්ගේ සංගමය විසින් නිකුත් කරන ලද රබර් වල නිති හා රෙගුලාසිවලට අනුව ලංසුකරු පිළිගනු ලබන අතර මිටිය පහලට වැටෙන අවස්ථාවේදී විකිණීම අවසන් කල යුතුය. විකිණීමේ වටිනාකම තීරණය කරනු ලබන්නේ එකඟ වූ මිල සහ ප්‍රමාණය අනුව සහ විකුණුම් සටහන් ඉහලට එසවීමෙන් වේ.

(c) දැව වගාව අස්වනු නෙලීම

නෛතික හිමිකාරිත්වය සහ ගැනුම්කරුට අලාභ මාරුවීමේ අවධානම සහ විකුණන ප්‍රමාණය තීරණය කල විට දැව විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනාගැනේ.

(d) දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න බැහැර කිරීම මත ආදායම් ස්වභාවයේ ලාභ හා අලාභ

ලාභය හෝ අලාභය තීරණය වන්නේ ශුද්ධ විකුණුම් ආදායම රැගෙන දේපල, යන්ත්‍රෝපකරණ සහ ආම්පන්න සමග සංසන්ධනය කිරීමෙන් වන අතර එම වත්කම්වල පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිකරණය කරනු ලබන වෙනත් සුදුසුකම් සහිත වත්කම් තුල ශුද්ධ ලෙස හඳුනා ගැනේ.

(e) බදු ආදායම්

මණ්ඩලය විසින් ඉඩම් හා කර්මාන්තශාලා විවිධ පාර්ශවයන්ට බදු දි ඇති අතර ඔවුන් ගෙන් ලැබනෙ ආදායම බදු ආදායම ලෙස හඳුනාගෙන ඇත. ඒවා ලැබීම් මත මාසිකව සහ වාර්ෂිකව ගණනය කරයි.

(f) රාජ්‍ය දීමනා

ප්‍රදානයන් මුලින් හඳුනාගනු ලබන්නේ ඒවා ලැබෙනු ඇති බවට සාධාරණ සහතිකයක් ඇති විට සහ මණ්ඩලය ප්‍රදානය හා සම්බන්ද කොන්දේසි වලට අනුකූල වන විටය. වියදම් සඳහා මණ්ඩලය විසින් වන්දි ලබාදෙන ප්‍රදාන, පිරිවැය හඳුනාගත් කාල පරිච්ඡේදයන් තුල ක්‍රමානුකූල පදනමක් මත ලාභ හා අලාභ ප්‍රකාශය මගින් හඳුනා ගැනේ.

5.3.2 වියදම් හඳුනාගැනිම

ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා දරනු ලබන සියළු වියදම් වර්ෂය සඳහා ලබාගැනීමේදි ආදායමට අය කෙරේ. අළුත්වැඩියා කිරීමේ හා අළුත්කිරීමේ වියදම් සිදුවූ වර්ෂයේ ලාභය හෝ අලාභය පිළිබඳ ප්‍රකාශයෙන් අය කිරීම සිදු වේ.

මූල්‍ය පිරිවැය

ණය ගැනීමෙන් ඇති වූ පොලි වියදම, ලාභ හෝ අලාභ ලෙස සාධාරණ අගයකින් සමන්විත මූල්‍ය වත්කම්වල සාධාරණ අගයෙන් අය කරන ගාස්තුව හා ලාභ හෝ අලාභ ප්‍රකාශය මගින් හඳුනාගත් රැකුම් අපකරණ මගින් සිදුවන අලාභයන් මූල්‍ය පිරිවැයට අන්තර්ගත වේ. සුදුසුකම් ලත් වත්කමක් අත්පත් කරගැනිම, ඉදිකිරිම හෝ නිෂ්පාදනය කිරීම සඳහා ඍජුවම ආරෝපණය නොවන ණය ගැනීමේ පිරිවැය ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ලාභ හා අලාභ ප්‍රකාශයෙන් හඳුනාගැනේ. වගකිම්වල ඉතිරි ශේෂය මත නියත වරින්වර පොලී අනුපාතයක් බිහි කිරීම සඳහා මූල්‍ය කල්බදු ගෙවීම්වල පොලී වියදම් සංරචකය බදු කාල සීමාව තුල එක් එක් කාල පරිච්ඡේදයට වෙන්කරනු ලැබේ.

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

ලැබෙන පොලිය මුදල් ප්‍රවාහයක් ලෙස වර්ගීකරණය කර ඇති අතර ගෙවනු ලබන පොලිය වක්‍ර ක්‍රමය භාවිතයෙන් සකස් කර ඇත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා මුදල් ප්‍රවාහයක් ලෙස වර්ගීකරණය කර ඇත.

5. ශ්‍රී ලංකා වාර්තාකරණ ප්‍රමිත අංක 7 ට අනුකූලව සිදු කරන අනාවරණයන්

5.1. ලාභ / (අලාභ) සටහන් අංක 5 සහ 6

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ (ජනවසම) සමස්ත ආදායම ප්‍රධාන අංශ තුනකින් ව්‍යුත්පන්න වේ. එනම්: වතු අංශය, පාරිභෝගික අංශය සහ ප්‍රධාන කාර්යාලයයි. පාරිභෝගික අංශය විසින් වතු අංශයෙන් තේ මිලදී ගනු ලබන අතර, ඒවා රජයේ ආයතන සහ සමාගමෙන් බාහිර දේශීය පාරිභෝගිකයින් වෙත අලෙවි කරනු ලැබේ.

මෙම අංශ තුනේ ආදායම් ඒකරාශී කිරීමේදී, තේ විකුණුම් ආදායම වන රු. 55,769,190.00 මෙන්ම, තේ නිෂ්පාදන පිරිවැය වන රු. 55,769,190.00 ද දෙවරක් ගණනය වීමක් (Double counting) සිදුවී ඇත. එබැවින්, මෙම වර්ෂයේ සිට එම ද්විත්ව ගණනය කිරීම සමස්ත ආදායමෙන් සහ සමස්ත නිෂ්පාදන පිරිවැයෙන් ඉවත් කර නිවැරදි කර ඇත.

5.3 බැංකු ණය

ජනවසම විසින් 2020.05.06 දින ලංකා බැංකුවේ හයිඩ් පාක් (Hyde Park) ශාඛාවෙන් රු. මිලියන 140 ක ණයක් ලබාගෙන ඇත. මෙම ණය මුදල සඳහා 12.5% ක පොලී අනුපාතයක් (විචල්‍ය පොලී අනුපාතයන්ට යටත්ව) අදාළ වන අතර, මාස 3 ක සහන කාලයක් (Grace period) සහිතව මාස 24 ක ආපසු ගෙවීමේ කාලසීමාවක් ලබා දී ඇත. මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ඇපකර සුරැකුම මත මෙම ණය මුදල අප වෙත නිකුත් කර ඇත. 2021.12.31 දිනට මෙම ණයෙහි ශේෂය රු. 46,569,720.03 කි.

තවද, ජනවසම විසින් 2021 නොවැම්බර් මාසයේදී ලංකා බැංකුවේ හයිඩ් පාක් ශාඛාවෙන් රු. මිලියන 200.00 ක තවත් ණය මුදලක් 10.5% ක පොලී අනුපාතයක් (විචල්‍ය පොලී අනුපාතයන්ට යටත්ව) යටතේ ලබාගෙන ඇත. මෙම ණය මුදලද මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ඇපකර සුරැකුම මත අප වෙත නිකුත් කරන ලද්දකි.

5.4 කන්දල්ඔය සහ නාගස්තැන්න වතු මුදල් සොරකම පිළිබඳ හෙළිදරව් කිරීම

2011 සැප්තැම්බර් මස 09 වන දින කන්දල්ඔය සහ නාගස්තැන්න යන වතු දෙකෙහි සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් සම්බන්ධ සොරකමක් සිදුවිය. සොරාගත් මුදල් ප්‍රමාණයන් පහත පරිදි වේ:

කන්දල්ඔය වත්ත: රු. 1,531,160.00

නාගස්තැන්න වත්ත: රු. 1,256,046.50

සොරාගත් මුළු මුදල: රු. 2,787,206.50

මේ සම්බන්ධ නඩුව මහනුවර මහාධිකරණයේ විභාග වෙමින් පවතින අතර, හිටපු වතු අධිකාරි දිනාල් සමරනායක මහතා මෙම නඩුව සඳහා අධිකරණය හමුවේ පෙනී සිටී.

5.5 දැව වටිනාකම පිළිබඳ හෙළිදරව් කිරීම

වාණිජමය වශයෙන් වටිනාකමක් ඇති දැව තක්සේරු කිරීම 2021 වර්ෂයේදී සිදු කරන බව 2020 මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කරන ලදී. කෙසේ වෙතත්, 2021, 2022 සහ 2023 වර්ෂයන්හි කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන, 2020 වර්ෂයේ අවසන් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ රජයේ විගණනය වෙත ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී. එබැවින්, 2021 වර්ෂයේ ගිණුම්වලට වාණිජ දැව වටිනාකම ගැලපීම සඳහා ප්‍රමාණවත් කාලයක් නොමැති බැවින්, අදාළ ගැලපීම් 2024 වර්ෂයේදී සිදු කරනු ඇත.

.6 ජනවසම සතු ඉඩම් පිළිබඳ හෙළිදරව් කිරීම

ඉඩම් අංශය විසින් මූල්‍ය අංශය වෙත හෙළිදරව් කරන ලද තොරතුරු අනුව, 2024.07.15 දිනට යාවත්කාලීන කරන ලද ජනවසම සතු ඉඩම් විස්තර පහත පරිදි වේ:

විස්තරය	හෙක්ටයාර්	වතු සංඛ්‍යාව
නිල ගැසට් නිවේදන මගින් පවරා දී ඇති ඉඩම්	140,824.43	525
ජනවසම විසින් මිලදී ගත් ඉඩම්	0.74	2
රජය විසින් පවරා ගත් ඉඩම්	1,785.10	37
මුළු ජනවසම සතු ඉඩම්	142,610.27	564
පෞද්ගලික සමාගම් 20කට (RPC) බදු දී ඇති ඉඩම්	120,521.19	402*
ජනවසම විසින් බදු දී ඇති ඉඩම්	1,898.87	-
ජනවසම සතු නමුත් තවමත් බදු දී නොමැති (ජනවසම විසින් කළමනාකරණය කරනු ලබන) ඉඩම්	12,781.67	-
ජනවසම වෙතින් රජයේ ආයතන වෙත පවරා ගත් ඉඩම්	1,454.89	-
ජනවසම විසින් විකුණන ලද ඉඩම්	3.72	-
ජනවසම වෙතින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පවරා ගත් ඉඩම්	1,757.19	-
හඳුනා නොගත් ඉඩම්	4,192.74	

-

සටහන: ඉඩම් අංශය විසින් වතු 402 ක් ප්‍රාදේශීය වැවිලි සමාගම් (RPC) වෙත බදු දී ඇති බව අනාවරණය කර තිබුණද, ගැසට් නිවේදනයට අනුව එය 242 ක් පමණි. ගැසට් නිවේදනයට අනුව තොරතුරු පහත පරිදි වේ.

ගැසට් අංකය	වතු සංඛ්‍යාව	ගැසට් අංකය	වතු සංඛ්‍යාව
720/2	86	718/25	1
718/16	18	718/26	1
718/17	1	776/13	7
718/18	1	719/3	28
718/19	1	719/15	71
718/20	1	183/10	13
718/21	1	344/5	5
718/22	1	216/11	2
718/23	1	937/2	2
718/24	1	එකතුව	242

5.7 2021 වසර අවසානයේදී ජනවසම හි සිවිල් නඩු සහ ව්‍යවස්ථාපිත නඩු සංඛ්‍යාව

2021 වසර අවසානය වන විට ජනවසම ආයතනය සතුව පවතින සිවිල් නඩු සංඛ්‍යාව 266 ක් වන අතර, ව්‍යවස්ථාපිත නඩු (Statutory cases) සංඛ්‍යාව 817 කි. ව්‍යවස්ථාපිත නඩු සඳහා ගෙවිය යුතු මුළු හිඟ මුදල රු. 635,903,764.43 කි.

විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් වාර්තාව

විගණන හා කළමනාකරණ කමිටු වලින් අනාවරනය වූ කරුණු

1. මොන්ටක්‍රිස්ටෝ වතුයායේ අනවසර ගස් කැපීම සම්බන්ධව කරන ලද පරීක්ෂාව. JEDB/IAR/FOR/2020/05

මෙම සිද්ධියට අදාල නඩු වාර්තාව ලබාගෙන එකී බදුකරු බදු ගිවිසුම දැඩි ලෙස උල්ලංඝනය කර ඇතැයි සනාථ වන්නේ නම් එම ගිවිසුම අහෝසි කරගැනීමට ඇති හැකියාව පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගැනීම. ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය කර නව බදුකරුවෙකු තෝරාගැනීමෙන් පසුව අදාල අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව කටයුතු කිරීම.

ආයතනය සතුව බදු ගිවිසුම් 150කට වැඩි ප්‍රමාණයක් පවතින බැවින් බදුකරුවන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු සිදුකරන්නේද යන්න පසු විපරම් කිරීම ඉතා යෝග්‍ය බව නිරීක්ෂණය කරන ලදී. බදුකරුවන් ගිවිසුම් කොන්දේසි දිගින් දිගටම උල්ලංඝනය කරන්නේ නම් බදු ගිවිසුම් අවලංගු කිරීමට ඇති හැකියාව සොයා බලන ලෙසත් එවැනි බදුකරුවන්හට නැවත රජයේ ආයතන සමඟ බදු ගිවිසුම්වලට එළඹීමට නොහැකිවන පරිදි අසාදු ලේඛණයක් (Black List) ඉදිරියට පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගැනීම

.

2. හන්තාන වතුයායේ කාර්ය මණ්ඩල නිල නිවාස අනවසරයෙන් රැදී සිටීම හා එහි විදුලි බිල්පත් නොගෙවීම. JEDB/IAR/HT/2020/02

වතු අධිකාරි විසින් නිල නිවාසවල අනවසරයෙන් රැදී සිටින අයට නිල නිවාස භාරදෙන ලෙස ලියාපදිංචි ලිපි මඟින් දැනුම්දීම. වතු අධිකාරින් විසින් මෙතෙක් භාර නොදී ඇති නිල නිවාසවල රැදෙන්නන් සඳහා ගත් ක්‍රියාමාර්ගද ඔවුන්ගෙන් සති දෙකක් ඇතුලත ලිඛිතව ලබාගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී.

සියලුම වතුයායන්වල සිටින එකී අනවසර සේවක භුක්ති විඳින්නන් සඳහා රජයේ ඉඩම් සහ දේපල ආපසු පවරාගැනීම් යටතේ නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව නීති අංශය මඟින් වහාම දැනුවත් කිරීමට තීරණය කරන ලදී.
ඒ ඒ වතුයායන්හි අනවසර ලෙස රැදී සිටින්නන් ඔවුන්ගේ නමින්ම විදුලි බිල් ගෙවන්නේ නම් මාස 03ක් ඇතුලත එකී බිල්පත් වතු අධිකාරින් නමට වෙනස් කිරීමට කටයුතු කිරීම.

වතුයායන්හි සේවකයන්ගේ නිවාස සඳහා වෙන වෙනම මීටර් සවිකිරීමේ හැකියාව පිළිබඳව විදුලිබල මණ්ඩලයෙන් විමසීම් කර පිරිවැය ප්‍රතිලාභ තක්සේරුවක් සකස්කොට කමිටුව වෙත ඉදිරිපත් කිරීම.
අනවසරයෙන් රැදී සිටින සේවකයන්ගේ තොරතුරු ලේඛනයක් සකස් කිරීමට උපදෙස් දෙන ලදී.

3. කම්කරු නාම ලේඛනය (Labour Register) නියමිත පරිදි පවත්වාගෙන යෑම.

සියලුම වතුයායන්හි කම්කරු නාම ලේඛන නිසිපරිදි යාවත්කාලීනව පවත්වාගෙන යාම අනිවාර්ය වේ. සාමාන්‍ය පෙරට්ටුව (General Muster) මඟින් සේවකයන් සංඛ්‍යාව භෞතික සත්‍යාපනය කිරීමට වහාම පියවර ගත යුතුයි.

4. කම්කරුවන් කාර්යයන්හි යෙදවීම - Utilization of Workers
දළු නෙලීම හා කප්පාදු කිරීමට පමණක් අතිරේක කම්කරුවන් යොදාගැනීම සිදුකල යුතු බව වතු අධිකාරීන් දැනුවත් කිරීම. වතුයායේ කම්කරු උපයෝජනයෙන් 80% ක් දළු නෙලීම සඳහා අනිවාර්යයෙන්ම යොමුකල යුතු බවට අභ්‍යන්තර චක්‍රලේඛනයක් නිකුත් කිරීමට උපදෙස් දෙන ලදී.
කම්කරු උපයෝජණය පිළිබඳව මාසික වාර්තාවක් (ඒ ඒ වතුයායන් වෙන වෙනම) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තොරතුරු පත්‍රිකාවක් ලෙස (Information Paper) ඉදිරිපත් කිරීමට වහාම පියවර ගන්නා ලෙස නිර්දේශ කරන ලදී.

1.අවසන් ගිණුම් විගණනය 2017,2018, 2019

1.බදු ඉඩම් ශේෂ සංසන්දනය පිළිබඳව ප්‍රගතිය දැක්වෙන වාර්තාවක් කමිටුවට ඉදිරිපත් කිරීම.
2.රාජ්‍ය ආයතන වලින් දිර්ඝකාලීන ලැබිය යුතු ශේෂ හා සම්බන්ධ විශේෂ විගණනයක් සිදුකර නිර්දේශ 2021.06.30 දිනට ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කිරීම.
3.අත්තිකාරම් ගිණුම් විශ්ලේෂණය කොට එය නිවැරදි කිරීම. (2020 අවසන් ගිණුම් තුලින්)
4.කල්බදු ණය හිමි ගිණුම් පිළිබඳ කරුණු සොයා බලා එය නිවැරදි කිරීම.
5.2020.12.30 දිනට පාරිතෝෂික ශේෂයන්හි නිවැරදිතාව තහවුරු කිරීම. (2021.06.30 දිනට පෙර වතුයායන් 05ක් නිවැරදි කර කමිටුවට ඉදිරිපත් කිරීමට)

2.පාරිභෝගික අංශයේ විගණන වාර්තා

i.මණ්ඩලයෙහි ජන තේ අලෙවිය ප්‍රවලිත කිරීම සඳහා සුදුසු අලෙවිකරණ ප්‍රතිපත්තියක් සැකසීම. එහිදී මුදල් ප්‍රවාහය, වට්ටම් සම්බන්ධ සීමා, නව වෙළඳපොළ විභවයන්, වෙළඳපොළ ක්‍රමෝපායන්, අවශ්‍ය තේ ප්‍රමාණය මණ්ඩලයේ කර්මාන්තශාලා වලින්ම සපුරා ගැනීමට ඇති හැකියාවන් පිලිබඳව විශේෂ අවධානය යොමු කිරීමට යෝජනා කරන ලදී. මෙම අලෙවි ප්‍රතිපත්තිය මාස දෙකක් ඇතුලත සකස්කොට අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කොට ක්‍රියාවට නැංවීමට උපදෙස් දෙන ලදී.

ii.ගබඩා පාලනයේ ඇති දුර්වලතාවයන් නිසා තේ කොළ ඇසුරුම් විනාශ වී ඇති බව නිරික්ෂණය කරන ලදී. මෙය වලක්වා ගැනීමට වහාම ක්‍රියාකල යුතු අතර අවශ්‍යතාවයට සරිලන ඇසුරුම් ප්‍රමාණය පමණක් ප්‍රසම්පාදන සැලැස්මට අනුව ඇණවුම් කිරීමට කටයුතු කල යුතුය.

iii.2020 වසරේ සතොසට කරනලද විකුණුම් හා ආපසු එවුම් පිළිබඳ වාර්තාවක් කමිටුවට ලබාදීම.

iv.අබලි ද්‍රව්‍ය බැහැර කිරීම සඳහා කමිටුවක් පත්කර ගබඩා පරිශ්‍රයේ සහ පාරිභෝගික අංශයේ පවතින අනවශ්‍ය ද්‍රව්‍ය වහාම බැහැර කිරීමට කටයුතු කරනලෙස දන්වන ලදී. සෑම මාස තුනකට වරක් මෙය ක්‍රියාත්මක කිරීමට උපදෙස් දෙන ලදී. කමිටුව සඳහා ගණකාධිකාරී, අභ්‍යන්තර විගණක සහ සාමාන්‍යාධිකාරී පත් කරන ලදී.

v.කළමනාකරු (පාරිභෝගික අංශය) ඔහුගේ රාජකාරි ලැයිස්තුව කමිටුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. කළමනාකරු වෙත පැවරෙන රාජකාරි නිසි පරිදි අනලස්ව ඉටු කිරීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය වන අතර මෙය නිවැරදිකර ගැනීමට වහාම කටයුතු සිදු නොකලහොත් පරිවාස කාලය වසරකින් දීර්ඝ කිරීමට යෝජනා කරන ලදී.

vi.භාවිතාකල නොහැකි ඇසුරුම් ද්‍රව්‍ය (Damage Packing Materials) – භෞතිකව ගබඩාව තුල අඩුවන බව නිරීක්ෂණය විය. ඒ සම්බන්ධ වාර්තාවක් සකස්කොට ජනවසමට සිදුවන පාඩුව වගකීම් පවරා ඇති නිළධාරින්ගේ මාසික වේතනයෙන් වහාම අයකර ගැනීමට කටයුතු කිරීම.

ඇණවුම් කල ඇසුරුම් ද්‍රව්‍ය භාරගැනීමට පෙර සාම්පල පරීක්ෂාවක් අනිවාර්යෙන්ම සිදුකල යුතුය. එසේ සිදුකිරීමෙන් අනතුරුව, ඇසුරුම් ද්‍රව්‍ය නියමිත පරිදි ගබඩා අංශයට ලැබුණු පසු මුදල් ගෙවීමට වගබලාගත යුතුය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් ඉදිරියේදී සිදුවිය හැකි අලාභයන් අදාල නිලධාරියා ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය.

3.අංශ ප්‍රධානින්ගේ රාජකාරි පැවරුම් (වතු කාර්ය මණ්ඩල, ප්‍රධාන කාර්යාල කාර්ය මණ්ඩලය)
වාර්ෂික කාර්ය සාධනයට අනුව අංශ ප්‍රධානීන් වෙත පවරන ලද රාජකාරිය නිසි ලෙස ඉටුකිරීම පිළිබඳව සෑහීමකට පත්නොවන්නේ නම් ඔවුනට අදාල වාර්ෂික වැටුප් වර්ධකය 2021වසරේ සිට විලම්භනය කිරීමට තීරණය කරන ලදී.

4.මණ්ඩලය විසින් පවත්වාගෙන යන විශේෂ ව්‍යාපෘති

•මණ්ඩලය සතුව පවතින මූල්‍ය දුෂ්කරතා අවම කර ගැනීම සඳහා මණ්ඩලයේ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු ලෙස සැලකෙන ජන තේ වැවිලි සහ තේ කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා පමණක් සියලු පරිශ්‍රමයන් යොදා (ඉඩම්, තේ, ජන තේ) එහි ඇති අඩුපාඩු අවම කොට උපරිම ලාභ ලබන ආකාරයෙන් ඉදිරියට යා යුතු අතර වතුයායන් හි ආරම්භ කොට ඇති එළවළු වැවීම් , තේ විකිණීම් වැනි සියලුම අමතර ක්‍රියාකාරකම් වලින් ආර්ථික වාසි අත්කර ගැනීමට අපොහොසත් වී ඇති බැවින් ඒවා නතර කිරීමට සුදුසු බව යෝජණා කරන ලදී.

•මේ සම්බන්ධයෙන් 2021/01/31දිනට ඒ ඒ වතුයාය මගින් සිදුකල විශේෂ ව්‍යාපෘතිවල පහත විස්තර ඇතුලත් වාර්තාවක් කමිටුවට ඉදිරිපත් කිරීම.

වතුයාය	විශේෂ ව්‍යාපෘති	වියදම	ආදායම	ලාභය

5.ලූල්කඳුර වතුයාය - JEDB/IAR/LC/2020/01
ඇසුරුම් ද්‍රව්‍ය - කර්මාන්තශාලාව

ගබඩා භාරකරු විසින් සියලුම ඇසුරුම් ද්‍රව්‍ය කර්මාන්ත ශාලාවට අභ්‍යන්තර නිකුත් කිරීම් පත් වලින් සටහන් කර නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට තීරණය විය.

ලියාපදිංචි/ලැයිස්තු ගත ගැනුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා කසල තේ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම කඩිනම් කිරීමට හැකියාව පවතී. මෙහිදී දින 3- 5ක් ඇතුලත මිල ගණන් ලබාගෙන ටෙන්ඩරය ඉදිරියට ගෙනයාමට අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් දෙන ලදී. මෙමගින් කර්මාන්තශාලාවල සිදුවන අක්‍රමිකතා අවම කර ගැනීමට අපේක්ෂා කෙරේ.

6.නිකුත් කරනලද අභ්‍යන්තර චක්‍රලේඛන යාවත් කාලීන කිරීම

මෙතෙක් නිකුත් කර ඇති අභ්‍යන්තර චක්‍රලේඛන වර්තමානයට සුදුසුවන පරිදි සහ සියලුම අභ්‍යන්තර ක්‍රියාපටිපාටින් ආවරණය වන පරිදි සකස්කර වතුයායන් වෙත ක්‍රමානුකූලව භාරදී ඒවාට අනුගතව කටයුතු කිරීමට උපදෙස් ලබාදීම.

7.නඩත්තු අංශය ස්ථාවර වත්කම් පරික්ෂාව

අංශ ප්‍රධානීන් විසින් තම අංශයේ ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යායුතු අතර වර්ෂාවසාන තොග සමීක්ෂණයේදී අනිවාර්යයෙන්ම ඉදිරිපත්කල යුතුය.

8.කර්මාන්තශාලා අවධාරිතාවෙන් ක්‍රියාත්මක වීම

මණ්ඩලයේ කර්මාන්තශාලා අවධාරිතාවෙන් ක්‍රියාත්මක වන බැවින් අමු තේ දළු උපරිම ලෙස ජනවසම තේ කර්මාන්තශාලාවලට යොමුකිරීමට ඇති හැකියාව සොයා බැලීමට උපදෙස් දෙන ලදී. එමගින් ජනවසම තේ වතුවලින් පිටතට විකුණන අමු තේ දළු ප්‍රමාණය පහත හෙලීමට හැකියාව පවතී.

9.මණ්ඩලයේ ස්ථීර සාමාන්‍යාධිකාරි.

මණ්ඩලයේ ස්ථීර සාමාන්‍යාධිකාරිවරයෙකු නොමැතිවීම මත එදිනෙදා කාර්යයන් සිදුකිරීමේදී ගැටළු මතුවන අතර සාමාන්‍යාධිකාරි ධූරය සඳහා දැනට පවතින නෛතික ක්‍රියාමාර්ග අවසන්වූ වහාම ඉල්ලුම්පත් කැඳවීමට අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් දෙන ලදී.

10.පුද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම.

නියමිත ක්‍රියාපටිපාටියකට අනුකූලව සිදු නොවන බව නිරීක්ෂණය වූ අතර පුද්ගලික ලිපිගොනු යාවත්කාලීනව පවත්වා ගැනීමට මානව සම්පත් අංශයට උපදෙස් දෙන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පිප්ප/ සි/ජේවිසිබ/01/202 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2025 සැප්තැම්බර් 09 දින

සභාපති

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙහි 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නීයාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය වියාවනය

ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සහ එහි පරිපාලිතයන්ගේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, නිර්පෙළ ගිවිසුම්වලින් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ කොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට දැමල යටහන්වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත, 1972 අංක 11 දරන රාජ්‍ය සංස්ථා පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යවා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාවනය සඳහා පදනම් කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට හැකියාව නොලැබී ඇත.

1.2 මතය වියාවනය සඳහා පදනම

(අ) මණ්ඩලය විසින් බදු පදනම් මත ලබා දී ඇති හෙක්ටයාර 123,306.37 ක් ඇතුළත්ව මණ්ඩලය සතු මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 142,592.27 ක් වුවත් මෙම ඉඩම්වල වටිනාකම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40 හි 34 ඡේදය ප්‍රකාරව නක්ශේරු කර මූල්‍ය ප්‍රකාශන තුළ දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. තවද හෙක්ටයාර 2,872.45ක ඉඩම් ප්‍රමාණයක් මණ්ඩලය විසින් 2025 මාර්තු 25 දින වන විටත් නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය අනුව දේපල පිරියත හා උපකරණවල සුන්බුන් වටිනාකම් සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 36 - 39 | +94 11 2 88 72 33 | agm@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

සමාලෝචිතය කර නැවත නක්ශේරු කළ යුතු වූවන්. සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට තවදුරටත් භාවිතා කරමින් පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වටිනාකම රු.503,460,537ක් දේපල පිරියක හා උපකරණ පිරිවැය සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 55 ඡේදය ප්‍රකාරව හා මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති 3.2.3 ප්‍රකාරව වත්කම් පාවිච්චි කිරීම සඳහා සුදුසුම තත්ත්වයට ගෙන ආ පසු එම වත්කම් ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවද, 2021 වර්ෂය තුළදී වාහනයන් සහ ප්‍රධාන කාර්යාලය විසින් මිලදී ගන්නා ලද රු.22,393,425ක් වූ ස්ථාවර වත්කම් මිලදී ගත් දිනය නොසලකා සම්පූර්ණ වර්ෂය සඳහම් ක්ෂය කර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 50 වන ඡේදය ප්‍රකාරව අස්ථිත්වයේ ගෙවිය යුතුලාභ බැඳීම ගණනයේදී ආයුගණන ක්‍රමය යොදාගෙන ගණනය කිරීම් කළ යුතු වුවද, මණ්ඩලය විසින් ප්‍රතිලාභ ගණනයේදී සේවකයකුගේ වර්ෂ අවසානයේ ලබන මූලික වැටුප පමණක් පදනම් කරගෙන සේවය ප්‍රතිලාභ ගණනය කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 12 ඡේදය ප්‍රකාරව රු.40,769,359ක් වූ පාරිභෝජ්‍ය නිවි විද්‍යාත්මක වත්කම් වටිනාකම් වාර්ෂිකව තක්ශේරු නොකර ස්ථාවර අගයක් ලෙස ඉදිරියට ගෙනා එමින් පැවතුණි.එසේම එම ශේෂය සත්‍යාපනය කර ගැනීම් සඳහා වාර්ෂිකව යාවත්කාලීන කරන ලද ගස් සංගණන හා තක්ශේරු වාර්තාද විගණනයට ඉදිරිපත් කර නොතිබුණු දහර ගම්මලෝචිත වර්ෂයේදී විකුණූ පාරිභෝජ්‍ය නිවි විද්‍යාත්මක වත්කම් වල විකුණුම් ආදායම රු.131,963,104 ක් වුවද ගස්වලට අදාල පිරිවැය වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම ප්‍රමිතියෙහි 54 (ඇ) ඡේදය ප්‍රකාරව රු.9,052,059ක් වූ වෙනත් නිවි විද්‍යාත්මක වත්කම්වල ක්ෂය ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී කල්බදු පදනම් යටතේ ලබාගෙන තිබුණු රු.6,150,000ක් පිරිවැය වූ ට්‍රැක්ටර් රථ 03ක කල්බදු වගකීම් ලෙස 2021 වර්ෂයට අදාලව රු.3,101,643ක් මූල්‍ය ප්‍රකාශනය තුළ හඳුනාගෙන යුතු වුවද, මණ්ඩලය විසින් රු.5,452,725ක් හඳුනා ගැනීම් හේතුවෙන් කල්බදු වගකීම රු.2,351,085කින් අධිගණනයවී තිබුණි.

(උ) 2016 වර්ෂයේදී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කළ වතු සංවර්ධන ව්‍යාපෘතියට අදාලව හෙවිලි තහඩු මිලදී ගැනීම සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් වැය කරන ලද රු.4,136,733ක් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළ වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයක් ලෙස වර්ෂ 10 කට අධික කාලයක් අය නොවී පවතින බව නිරීක්ෂණය වුවද ඊට අනුකූලව අවශ්‍ය වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශවල සිදු කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පරිණත කාලය ඉක්මවූ රු.10,000,918ක් වූ වගාවන් පරිණත වගාවට මාරු නොකර නොමෙරු භෝග යටතේ දක්වා තිබුණි.

(එ) 2021 දෙසැම්බර් 31 දිනට පාරිභෝජ්‍ය අංශයේ පැවති රු.2,744,595 ක තොග ශේෂය තුළ ඇතුළත් රු.2,369,453ක් වූ තේ තොගය මහනිකව නොමැති වුවද තොගයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම වාහනයන් 11කට අදාලව රු.2,761,476ක තොග ශේෂය මහනිකව නොපැවතිය ද මූල්‍ය ප්‍රකාශන තුළ තොග වටිනාකම් වගයෙන් හිඟුම්ගත කර තිබුණි.

(ඒ) නොසැයෙදුණු පාලන ගිණුම්

(i) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා රාජ්‍ය බැංකුව වෙතින් ලැබිය යුතු පොලී සහිත ණය ශේෂය රු.119,318,496ක් වුවද සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.97,709,342ක් වුයෙන් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනා හා මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනා අතර රු.21,609,154ක වෙනසක් පැවතුණි.

(ii) මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රධාන කාර්යාලයේ සහ වතුයායන්ගේ දේපල පිරියත හා උපකරණ සහ ජීව විද්‍යාත්මක වත්කම්වලට අදාල සමුච්චිත ක්ෂයවීම්වල ආරම්භක ශේෂය රු.901,981,969ක් වුවද ස්ථාවර වත්කම් ලේඛනය අනුව එය රු.898,991,053ක් වුයෙන් මූල්‍ය ප්‍රකාශන හා ලේඛන අතර රු.2,990,916ක වෙනසක් පැවතුණි.

(iii) මූල්‍ය ප්‍රකාශන අනුව දේපල පිරියත හා උපකරණ සහ ජීව විද්‍යාත්මක වත්කම්වලට අදාල සමුච්චිත ක්ෂයවීම්වල අවසාන ශේෂය රු. 931,613,515ක් වුවද ස්ථාවර වත්කම් සහ ජීව විද්‍යාත්මක වත්කම්වල ක්ෂය ගණනය කිරීම්වලට අදාල උපලේඛනය අනුව එය රු.928,510,156ක් වුයෙන් මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන අතර රු.3,103,359ක වෙනසක් පැවතුණි.

(iv) මූල්‍ය ප්‍රකාශන අනුව වතුයායන්ගේ ගස් විකිණීමේ ආදායම රු.129,765,958ක් වුවද වන කළමනාකරණ අංශයේ උපලේඛනය අනුව එය රු.131,963,104ක් වුයෙන් මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන අතර රු. 2,197,146ක වෙනසක් පැවතුණි.

(ඔ) මොන්ත්‍රැස්සෝ වතුයාය 2003 වර්ෂයේ සිට විවිධ පාර්ශව වෙත බදු දී තිබෙන අතර මෙම වතුයායේ දේපල පිරියත හා උපකරණ ශේෂය සහ ජීව විද්‍යාත්මක වත්කම්වල පිරිවැය මූල්‍ය ප්‍රකාශන අනුව රු.32,168,955ක් විය. මෙයට අදාලව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර වත්කම් සම්බන්ධයෙන් භෞතික පරීක්ෂාවක්ද මණ්ඩලය විසින් සිදු කර නොතිබුණු බැවින් එම වත්කම්වල අගය හා සැලැත්ම විගණනයට නඟවුරු කර ගැනීමට නොහැකි විය.

(ක) මණ්ඩලය විසින් මුල්හල්කැලේ වතුයායේ රු.1,067,176ක පැරණි ගෙවිය යුතු පාරිනෝෂික ශේෂය මුළු ගෙවිය යුතු පාරිනෝෂික ශේෂයෙන් අඩු කර තිබීම නිසා මණ්ඩලයේ ගෙවිය යුතු පාරිනෝෂික ශේෂය එම වටිනාකමින් අවගණනයවී තිබුණි.

(ඛ) 1996 වර්ෂයට පෙර සිට අවිනිශ්චිත ගිණුම් යටතේ දක්වා ඇති රු.4,342,561 ක හර ශේෂයක් හා රු.1,863,756 ක බැර ශේෂයෙන් නිරවුල් නිරීමට කටයුතු කර නොතිබුණි.

(ග) මහවැලි විභාජනයට යටවී හෙක්ටෙයාර පැවැත්මක් නොවැති ශේෂය රු.6,013,927ක් වූ මහවැලි අධිකාරිය විසින් පවරා ගෙන තිබූ ඔනුගල්ඔය වතුයායේ ශේෂය මූල්‍ය ප්‍රකාශන තුළින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඝ) දේපල පිරියත හා උපකරන වටිනාකම් තුළ දක්වා ඇති රු.39,287,968ක් වූ කෙරී ගෙන යන වැඩ ශේෂය තුළ කෙරී ගෙන යන වැඩ ලෙස ගදුනාගත නොහැකි පරිත්‍යාග සහ ශ්‍රීරකරුවකුගේ වැටුප් වශයෙන් ගෙවා තිබුණු රු.5,129,989ක වියදම්ද ඇතුළත්ව තිබුණි.

(ට) විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

(i) මණ්ඩලයේ දේපල පිටියන හා උපකරණ ශේෂය තුළ ඇතුළත් ප්‍රධාන කාර්යාලයේ ඉඩම්, ගොඩනැගිලි සහ වතුකරයන්ගේ ගොඩනැගිලි, බැලි හෝරේ මිහිටි ගබඩා කාර්යාල සහ පාරිභෝජ්‍ය අංශයට අදාල ගොඩනැගිලිද්‍ර, වෙනත් දේපල පිටියන හා උපකරණ යන වතුයායන් තුළ ක්‍රියාත්මක කර තිබුණු ජල සම්පාදන ව්‍යාපෘතියෙහි ශේෂ පිළිබෙලින් රු.1,541,657,072ක්, රු. 288,204ක්, රු.9,631,812ක් සහ රු.10,423,220ක් වූ වත්කම් ශේෂයන්ට අදාල සැදුනුම් පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් ඉඩම්වල සිදුරුපත්, සැලසුම්, නක්ෂේරු වාර්තා, පැවරීමට අදාල ගැසට් පත්‍ර, වාර්ෂික ඉංජිනේරු සහතික වාර්තා, වර්ග අඩි ප්‍රමාණය, ඉංජිනේරු සැලසුම් යනාදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) වතුයායන්හි ශ්‍රේණිගත සහ වැඩ වර්ජනයකට තුළ ඇතුළත් විශේෂ සහ වෙනත් ව්‍යාපෘතිවල ශේෂය රු.6,685,165ක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණද එම ව්‍යාපෘතිවල පැවැත්ම,සම්පූර්ණත්වය,වියදම් වෙන්කිරීමේ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා එම ව්‍යාපෘති සම්බන්ධයෙන් පෙරිමි වවුචර්පත්,වැටුප් ගෙවීම් විස්තර, පිරිවැය වාර්තා සහ ඇනුමිැනීන්,අනුමත ඇග්තමේන්තු යනාදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) මෙම විද්‍යාත්මක වත්කම තුළ රු.17,925,652ක මණ්ඩලය වෙත පැවරුණු පරිහරණ වගාව ලෙස දක්වා තිබූ ශේෂයට අදාල සැදුනුම් පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් ගත් පංහනන වාර්තා සහ වත්තාකරු නක්ෂේරු කිරීමට අදාල වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iv) සමුච්චිත ශේෂය රු.40,674,433ක් වූ ප්‍රධාන කාර්යාලයේ සහ වතුයායන්ට අදාල වෙළෙඳ හා අනිකුත් ලැබිය යුතු දෑ තුළ ඇතුළත් බැලපුම් ශේෂය සහ පාරිශෝධිත ලංගෙයේ පැරණි ණය ගැනි ශේෂයක්ද, රු.17,649,620ක් වූ ලැබිය යුතු රඳවාගත් මුදල්, වැවිලි සංවර්ධන ව්‍යාපෘතිය සහ එකතු කළ අගය මත බදු ශේෂයන්හි සහ විවිධ ණයගැනි ශේෂය තුළ ඇතුළත් මොන්න ක්‍රිස්ටේ වතුයායට අදාල රු.40,503,226ක් වූ ශේෂ සම්බන්ධයෙන් සැදුනුම් පරීක්ෂා කිරීමට ශේෂ සහතාරා, ශේෂ පත්‍ර දිගහැරීම් පසු සියවීම් සහ කාල විශ්ලේෂණ සහ අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග යනාදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(v) මණ්ඩලයේ වෙළඳ ගෙවිය යුතු ශේෂය තුළ ඇතුළත් රු.36,310,518ක් වූ මහවැලි නිවාස ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු ශේෂය සහ සංචිත ශේෂය තුළ ඇතුළත් සමුච්චිත ශේෂය රු.295,796,203ක් වූ වැවිලි සංවර්ධන ව්‍යාපෘතිය,වෙනත් නොවන පැරණි ගෙවූ සංචිත ශේෂයන්ට අදාල සැදුනුම් පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් ශේෂ සහතාරා කිරීමේ ලේඛන,කළ වැඩි වාර්තා සහ සහනික කළ බිල්පත් සහ කාල විශ්ලේෂණ අරමුදල් ලද ශ්‍රීලාලය සහ එය ගිණුම් ගත කිරීමට අදාල ප්‍රතිපත්තිය සහ ලද අනුමැතීන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(vi) මණ්ඩලය විසින් වත්කම් බදු දීමේදී ලබා ගන්නා නැමිපතු සහ අත්තිකාරම් ශේෂය තුළ ඇතුළත් රු.49,603,011ක් වූ කල්බදු වත්කමට එරෙහිව නැන්පතු (Deposit against Asset Lease) ශේෂය, සමුච්චිත ශේෂය රු.196,789,988ක් වූ ඉඩම් සහ ගොඩනැගිලි බදු දීමට අදාල අත්තිකාරම්,ප්‍රධාන කාර්යාලයේ ආපසු ගෙවිය යුතු තැම්පතු සහ ආරක්ෂිත නැන්පතු යන වතකීම් සහ සමුච්චිත ශේෂය රු.6,129,868ක් වූ සාධාරණ අගය වෙළඳ ණයගැනි ශේෂය සහ ප්‍රධාන කාර්යාලයේ කල්බදු ණයගැනි ශේෂයට අදාල සැදුනුම් පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් ශේෂ සහතාරා කිරීමේ ලේඛන,තැම්පතුවලට අදාල උදු පත්,කාල විශ්ලේෂණ යනාදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(vii) මණ්ඩලයේ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂය තුළ ඇතුළත් සම්පූර්ණ ශේෂය රු. 91,687,834ක් වූ ගෙවිය යුතු බදු වගකීම්වලට (VAT,NBT,ESC) සහ රු.134,966,186ක් වූ ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් හා වෙනත් ශේෂයට අදාළ සැසඳුම් පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලද සහන කාලසීමාවන්, කාලීන ගෙවීම්වලට අදාළ වසූවරදත්, නොගෙවීමට අදාළ පැහැදිලි කිරීම් හා ලිඛිත ලේඛන සහ කාල විශ්ලේෂණ සහ විස්තරාත්මක ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(viii) සමුච්චිත ශේෂය රු.161,060,658ක් වූ පොළී සහිත ණය ගැනීම් සහ මහජන බැංකුව වෙතින් ලබා ගත් ණය මුදලට අදාළ සැසඳුම් පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් ශේෂ සහතික කිරීමේ ලේඛන, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය,ණය ගිවිසුම්,පොළිය සහ ණය ගෙවීම් විස්තර සහ ශේෂ සහාථන යනාදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඩ) අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩව අදාහ දැක්වීම මත 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ශුද්ධ වත්කම් හා කාරක ප්‍රාග්ධනය පිළිවෙලින් රු.1,285,528,242ක හා රු.2,148,404,725ක සෘණ අගයන් ගෙන තිබුණ් අතර එදිනට පැහැර නහින ලද ව්‍යවස්ථාපිත ගෙවීම් රු.2,067,043,833ක් වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පාරිභෝගික ලෙන්කිරීම් ශේෂය රු.927,760,728 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.636,200,235ක ගෙවිය යුතු පාරිභෝගික ශේෂයක් ද පැවතුණි. මෙම බැඳීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයන්ද සිදුකර නොතිබුණු අතර පියවිය යුතු බැංකු ණය ශේෂය රු.269,540,047ක් වී තිබුණි.මේ අනුව මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණෘත්මක අවිනිශ්චිතතාවයක් පවත්නා බව නිරීක්ෂණය විය. එසේම 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 2.4 මගින් අධ්‍යක්ෂ මණ්ඩල නිර්ණ ප්‍රකාරව මණ්ඩලය ප්‍රතිසංවිධානය කළ යුතු බව හෙළිදරව් කර තිබුණද විගණිත දිනය වන 2025 මාර්තු 03 දින දක්වාම එබඳු ප්‍රතිසංවිධානයක් සිදු කර නොතිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තිරණ ආදායම ප්‍රකාශනයේ, හිමිකම වෙනස්වීම් ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට හිට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තිරණ ආදායම ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැසඳීමෙහා වර්තමාන හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වර්තමාන හෝ ගනුදෙනු යම්කිසි ආකාරයකින් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ සාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් නිර්ණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ ගැඹියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාහාරිත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙතෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම් මත ගිණුම් නැවීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට පදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන විළිඹයල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි ගිණුම්කළ හා වෘත්තීය පරීක්ෂණයන් යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ.එකඟයේ වුවද, මතය ප්‍රකාශනය සඳහා පදනම් කොටගෙන් විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් පරිමාන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන ගනාමැති අතර නිසි ගිණුම් වාර්තා මණ්ඩලය තබා තිබෙන බවත් පෙනී සිටීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (අ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉහත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (අ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉහත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගත්තා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම හේතු, පහත සඳහන් ප්‍රකාශ කිරීමට කරම කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ආ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධව යම් නිවිසුම්ක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයෙන් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයන්ට බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ ගැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද රවනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම
(අ)	1983 අංක 12 දරන පාරිභෝගික ගෙවීම් පනතේ 11 වන සහ සාරයේ 5 (1) උප වගන්තිය	සේවකයකු විශ්‍රාම ගිය හෝ මරණයට පත් දින සිට දින 30 ක් ඇතුළත පාරිභෝගික ගෙවීම් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට රු.636,200,235ක ගෙවිය යුතු පාරිභෝගික දේෂයක් සහ රු.182,245,195 ක ගෙවිය යුතු අධිභාර දේෂයන් ද පැවතුණි.
(ආ)	1998 අංක 15 දරන සංශෝධිත සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 වගන්තිය	ගෙවිය යුතු අර්ථසාධක ලෙස රු.995,794,224ක් ද වතු කර්මික මණ්ඩල අර්ථසාධක සංගමයට (ESPS) සහ ලංකා වැවිලිකරුවන්ගේ සර්ව්සාධක සංගමයට (CPPS) රු.129,774,730 ක නිබඳ දේෂයක්ද පැවතුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රකාශන අනුව ඉහත අරමුදල් සඳහා රු.39,824,048ක ගෙවිය යුතු අධිභාර ද ගෙවා නොනිබුණි.
(ඇ)	1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ 16 (1) වන උප වගන්තිය	2011 වර්ෂයේ සිට සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු රු.82,369,546ක දායක මුදල් ගෙවා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට මූල්‍ය ප්‍රකාශන අනුව භාරකාර අරමුදලට රු.835,855ක ගෙවිය යුතු අධිභාර දේෂයක්ද විය.
(ඈ)	2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ 93 වන වගන්තිය	2021/2022 නක්කේරු වර්ෂයට අදාළ ආදායම් බදු විවරණය 2024 පෙබරවාරි 11 දින ඉදිරිපත් කර නිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් පසුපුරුවම ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රයෝජනයට ගෙ භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ). 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය යටතේ රක්නපුර රාස්නගල වත්තේ ඉඩම් අක්කර 1824 රූඩ් 01 පර්චස් 36න් අක්කර 50ට වැඩි ප්‍රමාණයකින් 20 දෙනෙකු වෙනුවෙන් අක්කර 1,270 රූඩ් 02 පර්චස් 30ක් 1996 දෙසැම්බර් 05 දිනැති ලිපිය පරිදි කොමිෂන් සභාව පවරා ගෙන තිබුණි. ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය යටතේ ප්‍රමාණයකින් නොවන අක්කර 50ට අඩු ඉඩම් හිමි පුද්ගලයින් 24 දෙනෙකු සඳහා අක්කර 462 රූඩ් 02 පර්චස් 14ක් අයත්ව තිබුණු අතර ව්‍යවස්ථාපිත නිශ්චය යටතේ පුද්ගලයින් දෙදෙනෙකුට අක්කර 91 පර්චස් 32ක් නොබෙදූ ඉඩම් විෂයෙන් වෙන් කර නිබුණි.

මෙහේ පවරා ගනු ලැබූ ඉඩම් වෙනුවෙන් විකල්ප ඉඩම් නොලැබීම නිසා ඉඩම් ලබාදෙන මෙන් ඉල්ලා පුද්ගලයින් 46 දෙනෙකු විසින් 1999 මාර්තු 04 දින වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඇතුළු 06 දෙනෙකුට එරෙහිව නඩු අංක 1041/98 මඟින් නඩු පවරා තිබුණි.

උක්ත නඩුව සම්බන්ධයෙන් පත් කර තිබූ පාර්ශවකරුවන්ට විකල්ප ඉඩම් ලබා දීම පිළිබඳ තීන්දුවක් ලබා දීම සම්බන්ධ නඩු වාර්තාවද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1982 මාර්තු 12 දිනැති අංක 183/10 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට කෘෂිකාර්මික කටයුතු කළමනාකරණය සඳහා පැවරී තිබූ හන්නාන වතුයායෙන් අක්කර 45 රූඩ් 1 පර්චස් 16ක් ඔප්පු දෙකක් මගින් 2003 හා 2004 වර්ෂවල හිටපු අමාත්‍යවරයාගේ බිරිඳගේ සහ ඇයගේ සහෝදරයාට ලබාදී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

- පාර්ශවයන් 46 දෙනෙකු අතරින් ප්‍රකාශකයින් නොවන පාර්ශවකරුවන් 24 දෙනෙකු වෙත රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් හාගල වතුයායෙන් හෙක්ටයාර 206ක් ලබා දීමටත්, ප්‍රකාශකයින් නොවන හිටපු අමාත්‍යවරයාගේ බිරිඳගේ ඉල්ලීම හා මණ්ඩලයේ එකඟතාවය මත දැනට බිරිඳට හා ඇයගේ සහෝදරයාට හන්නාන වතුයායෙන් අක්කර 45 රූඩ් 1 පර්චස් 16ක් ලබා දීමටත් රාජ්‍ය වැවිලි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 07/SLSPC/October/2003 ට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් විගණනයට ඉදිරිපත් කොට්‍ය.)

- 2003 නොවැම්බර් 06 දිනැති අමාත්‍යාංශ ලේකම්ගේ විසින් නීතිපතිවරයා වෙත යොමු කරන ලද ලිපිය ප්‍රකාරව ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්නාන වතුයායෙන් විකල්ප ඉඩම් ලබාදීමට මණ්ඩලයේ එකඟතාවයකට එළඹ තිබුණි.

- පසුව එම දෙදෙනාට පැවරුම් ඔප්පු දෙකක් මගින් 2003 නොවැම්බර් 13 හා 2004 ජනවාරි 19 (ඔප්පු අංක 96 හා ඔප්පු අංක 3775) යන දිනයන්හිදී මණ්ඩලයේ හිටපු සභාපතිවරයෙකු හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු විසින් අයිනිය පවරාදී තිබුණි.

- අංක 1042/98 දරන නඩුවට අදාළ පාර්ශකරුවන් 46 දෙනෙකු නඩු පවරා තිබුණේ 1982 පෙබරවාරි 27 දිනැති අංක 181/12 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් රාජ්‍ය වැවිලි සංස්ථාවට පැවරී තිබුණු හාගල වතුයායෙන් විකල්ප ඉඩම් ලබාදීම් වෙනුවට ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්නාන වතුයායෙන් ඉහත නඩුවේ පාර්ශවකරුවන් දෙදෙනෙකුට පමණක් ඉඩම් ලබාදීමට මණ්ඩලය කටයුතු කර තිබුණි. තවද, ඉහත නඩුවේ ඉතිරි පාර්ශවයන් 44 දෙනෙකු වෙත මේ දක්වා ඉඩම් බැහැර කිරීමක් සිදු කළ බවට සඟවුරුවක් නොතිබුණි.

- රාක්ඟගල වතුයායෙන් හිමි ඉඩම් අක්කර ප්‍රමාණයට විකල්ප ඉඩම් වශයෙන් ඉහත පාර්ශවයන්ට වැඩි වටිනාකමක් තිබූ මහතුවර නගරයට ආසන්නයේ සිහිටි හන්නාන වතුයායෙන් වටිනාකම් තක්සේරුකිරීමක් සහමැතිවද මෙම ඉඩම් බැහැර කර තිබුණි.

- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ගේ 2006 ජූලි 26 දිනැති අංක එම්පීඅයි/ජී/1/1/1/3 දරන ය.ස්ථාගව් සභාපති වෙත යවන ලිපිය ප්‍රකාරව විකල්ප ඉඩම් වශයෙන් හාගල වතුයායෙන් හෙක්ටයාර 206ක් හා හන්නාන වතුයායෙන් අක්කර 45 රූඩ් 1 පර්චස් 16ක් නිදහස් කිරීමට 2003 වර්ෂයේ ඔක්තෝබර් මස වැවිලි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය එකඟ වී තිබූ බව දන්වා තිබුණි.

- මෙම පාර්ශවයන් විසින් හන්නාන වතුයායෙන් ලබා ගෙන තිබුණු ඉඩම් අක්කර ප්‍රමාණයෙන් සුවිශාල ඔප්පු අංක 145 මඟින් අක්කර 2 රූඩ් 01 පර්චස් 35ක් සහ ඔප්පු අංක 146 මඟින් අක්කර 01 රූඩ් 00 පර්චස් 5ක් බැගින් අක්කර 03 රූඩ් 02 ක් බාණිර පාර්ශවය වෙත 2011 මාර්තු 31 දින විකුණා තිබුණු බවද නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර නිබුණු තෙවී ගෙන යන වැඩවල ඇතුළත් කොමිසෝසිව් ඇතුළු සුළු උපනයන ආදායම් ව්‍යාපෘතීන් වෙතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු.27,814,517ක පිරිවැයක් දරා නිබුණද වර්තමානය වන විට ව්‍යාපෘතීන් ක්‍රියාත්මක නන්නවයේ කොතිබුණු අතර ඒ වෙනුවෙන් දරන ලද වියදම් අනාර්ථික වියදම් ඔවට පැවිදි නිබුණි.

(ඇ) ඉඩම් සහ ගොඩනැගිලි බදු දීම් සහ ගේ දළු විකිණීමට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.318,410,551ක ශේෂය තුළ වසර 3ට වැඩි රු.121,148,546ක ශේෂයන් පවතින අතර රු.මි.2කට වඩා වැඩි වසර 6 ඉක්මවූ රු.39,432,101ක් වූ ශේෂයක්ද අයකර ගෙන නොතිබුණි.

(ඈ) මණ්ඩලයේ හා වතුයායන් වල ආදායමෙන් සියයට 0.25 ක් බැර කර විධිමත් අනුමැතියකින් පසාරව "සභාපති ප්‍රසාදක අරමුදල්" නමින් අරමුදලක් 2020 වර්ෂයේදී පිහිටුවා නිබුණි. මෙම අරමුදලට සමාලෝචිත වර්ෂයේ තේ සහ රබර් ආදායමෙන් රු.1,993,624ක්ද, ජන ගහ අංගයේ ආදායමෙන් රු.924,040ක්ද වශයෙන් රු.2,917,664ක් බැර කර නිබු අතර මෙම අරමුදලින් ගස්වැකා පැළවීම් සහ විවිධ පරිතෘයාග පදනා රු.4,683,175ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර නිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.600,161ක ශේෂයක් ඉතිරිව නිබුණි.

(ඉ) මණ්ඩලයේ මූලික ප්‍රකාශන අනුව වතුයායන් විසින් උපයන ලද මෙනෙස් සදායම් හැර ප්‍රධාන ආදායම මූල්‍යාශ වන ගස් දළු විකුණුම් ආදායම්,නිශ්පාදිත ගස් විකුණුම් ආදායම්,වියුයාය තුළ ගේ විකුණුම් ආදායම සහ රබර් කිරි විකුණීමෙන් උපයන ලද වාර්ෂික ආදායම් සහ පාරිභෝජ්‍ය අංශයේ ගස් විකුණුම් යන ආදායම්වල එකතුව රු.1,204,225,143 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව විකුණුම් පිරිවැය රු.1,740,151,580 ක් වී නිබුණි. ඒ අනුව මණ්ඩලයට එමි ප්‍රධාන වියදම් ඉක්මවා ආදායම් උපයා ගැනීමට නොහැකිවී නිබුණි.

(ඊ) මණ්ඩලයේ වතුයායන්ට අදාල රු.42,528,311ක වෙළඳ ණයගැති ශේෂය තුළ වතුයායන් 05කට අදාලව 2004 වර්ෂයේ සිට තේ දළු විකුණුම් වලට අදාල රු. 2,641,925ක ණයගැති ශේෂයක් සහ වසර 5කට වැඩි රු.35,259,358ක් වූ ණයගැති ශේෂයන් ද පැරිභෝගික ණය ශේෂයේ වසර 03 ඉක්මවූ රු.12,639,676ක ණය ශේෂයක් පැවතියද එම ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.

(උ) හාඉස්කැන්න සහ කන්දුල්ඔය වතුයායන් වල පිළිවෙලින් රු.1,531,160 හා රු.1,256,046 ක මූදල් සොරා ගැනීම සිදු වී වසර 10ක් පමණ ගතවී නිබුණද, සමාලෝචන වර්ෂය අවසන් වන මන විටත් එහකිවයුතු නිලධාරීන්ගෙන් අලාභයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) වතුයායන්ගේ ණයගිමි කාල විශ්ලේෂණයට අනුව රු.129,845,276ක් වූ ණයගිමි ශේෂයෙහි, වතුයායන් 18ක වසර 05 ඉක්මවූ රු.94,601,161ක ණයගිමි ශේෂයන් ද, වතුයායන් 10ක වසර 4-5ක් අතර රු.4,183,637ක් වූ ණයගිමි ශේෂයක් විය. තවද ප්‍රධාන කාර්යාලයට අයත් රු.143,290,771ක වෙළඳ ණයගිමි ප්‍රවිභාගය තුළ වසර 6කට වැඩි රු.83,500,633ක සහ වසර 3-6 අතර රු.13,658,407ක ණයගිමි ශේෂයක් ද විය.

(එ) ගඩොක්ගෙවිල් රිදියේ පිහිටි මණ්ඩලය සතු ගබඩා 2ක් නරඹකාරී මිල ගණන් කැඳවීමකින් තොරව 2005 වර්ෂයේදී වසර 30කට රු.105,000ක මාසික බදු කුලියකට පෞද්ගලික ශමාගමක් වෙත බදු දී එම බදු ගිවිසුම් අවසන් වීමට පෙර නැවත එම බදුකරු සමඟ 2011 වර්ෂයේදී රු.105,000ක

මාසික බදු කුළී වටිනාකමකට වසර 30කට බදු ගිවිසුමකට එළඹී තිබුණි. පළමු බදු ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව, මාසික තක්සේරු වටිනාකමේ වැඩිවීම රු.95,000 බැගින් මාසික වාරික 49 ක් වෙනුවෙන් රු.4,655,000 ක් හා රු.175,000 බැගින් මාසික වාරික 14 ක් වෙනුවෙන් රු.2,450,000 වශයෙන් රු.7,105,000 ක් 2005 දෙසැම්බර් සිට 2011 පෙබරවාරි දක්වා තක්සේරු වාර්තා පදනම් කරගෙන බදු අය කර ගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොනිබුණි.

නවද 2011 මාර්තු මාසයේදී ඇතිකරගෙන තිබූ දෙවන බදු ගිවිසුමෙහි තක්සේරු වාර්තා පදනමව බදු අය කළ යුතු බවට ගිවිසුමේ වගන්ති ඉවත් කර ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කිරීම නිසා 2020 වර්ෂයේදී ලබා ගත් තක්සේරු වාර්තාවට අනුව මාසික තක්සේරු වටිනාකම රු.224,000ක් වූයෙන් වටිනාකම් වැඩිවීම රු.119,000 බැගින් මාසික වාරික 58 ක් වෙනුවෙන් රු.6,902,000 ක් සහ රු.353,000 බැගින් මාසික වාරික 36 ක් වෙනුවෙන් රු.12,708,000 වශයෙන් හා රු.438,000 බැගින් මාසික වාරික 36 ක් වෙනුවෙන් රු.15,768,000 ක් වශයෙන් රු.35,378,000 ක් 2011 මාර්තු සිට 2021 දෙසැම්බර් දක්වා තක්සේරු වාර්තාවට අනුව අයවිය යුතු බදු ආදායමක් මණ්ඩලයට අහිමිවී තිබුණි.

(ඒ) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් නොරව ප්‍රධාන කාර්යාලයේ සහ වතුයායන් වල ගිණුම්මය ක්‍රියාකාරකම් 7ක් ඉටුකර ගැනීමට අදාල මෘදුකාංග පද්ධතියක් සඳහා පෞද්ගලික සම්මාගමකට 2021 වර්ෂයේ සිට 2025 අප්‍රේල් 30 දක්වා මෘදුකාංග පිහිටුවීමේ සහ මාසික ගෙවීම් වෙනුවෙන් රු.13,989,750 ක් ගිවිසුම් ප්‍රකාරව ගෙවා තිබුණද, මෘදුකාංග පද්ධතිය මඟින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම,තොග පාලනය,ආදායම් හා වියදම් පාලනය යනාදී අරමුණු නිසි පරිදි ඉටු කර නොනිබුණි.

(ඔ) කෘෂිකාර්මික නිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා 2007 නොවැම්බර් මස සිට මණ්ඩලය සහ පෞද්ගලික සමාගමක් සමග නාගස්තැන්න වතු යාය බදු දීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණද, ගිවිසුම් ගත වී වසරක් ගතවීමට පෙර වතු යායේ ගස් 120ක් අනවසරෙන් කපා ඉවත් කිරීම හේතුවෙන් එය නැවත මණ්ඩලයට පවරාගෙන තිබුණු අතර එම ගස්වල අලාභ අයකර ගැනීමට 2008 මැයි මාසයේ පොළිස් අපරාධ දෙපාර්තමේන්තුවේ නඩුවක් පවරා තිබුණි. මණ්ඩලයේ වැවිලි කළමණාකරු විසින් 2008 වර්ෂයේදී ලබා දුන් ප්‍රකාශයට අනුව රු.11,200,000ක අලාභයක් මණ්ඩලයට සිදුවී ඇති බව දන්වා තිබුණද එම අලාභය තක්සේරු කර අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොනිබුණු අතර නඩු කටයුත්තද දෙපාර්ශවයේ එකඟතාවයෙන් අවසන් කර තිබුණි.

ජී.ඒ.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

කාර්ය සාධන වාර්තාව - 2021

1. හැඳින්වීම

ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, 2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන මෙම කාර්ය සාධන වාර්තාව ගෞරවපූර්වකව ඉදිරිපත් කරමි. සමාලෝචිත වර්ෂය තුළ පැවති ගෝලීය සහ දේශීය කොවිඩ්-19 වසංගත අභියෝග මධ්‍යයේ වුවද, මනා කළමනාකාරිත්වයකින් යුතුව නිෂ්පාදන ක්‍රියාවලිය පවත්වාගෙන යාමට අප ආයතනය සමත් විය. විශේෂයෙන්ම කෘෂිකාර්මික යෙදවුම් නිසි පරිදි භාවිතා කිරීම හේතුවෙන් නිෂ්පාදනය ඉහළ යාමේ යහපත් ප්‍රවණතාවක් මෙම වසර තුළ පෙන්නුම් කරන ලදී.

2. මෙහෙයුම් කාර්ය සාධනය (වතු අංශය)

ආයතනය සතුව පවතින තේ (හෙක්ටයාර 2,808.42) සහ රබර් (හෙක්ටයාර 510.18) වගාවන්හි කාර්ය සාධනය පහත පරිදි වේ.

තේ වගාව: 2020 වර්ෂයේ නිෂ්පාදනය වූ කිලෝග්‍රෑම් 1,486,272 ට සාපේක්ෂව 2021 වර්ෂයේදී කිලෝග්‍රෑම් 1,605,312 ක වාර්තාගත නිෂ්පාදනයක් ලබා ගෙන ඇත (කි.ග්‍රෑ. 119,026 ක වර්ධනයකි). සාමාන්‍ය ශුද්ධ විකුණුම් මිල (NSA) රු. 428.20 දක්වා ඉහළ ගියද, සාමූහික ගිවිසුම මගින් වැටුප් වැඩිවීම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය (COP) රු. 805.83 දක්වා ඉහළ ගොස් ඇත.

රබර් වගාව: අයහපත් කාලගුණය සහ ගස්වල වයස්ගතභාවය මත රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් 404,495 දක්වා සුළු අඩුවීමක් පෙන්නුම් කළද, වෙළෙඳපොළ මිල ඉහළ යාම මත ශුද්ධ විකුණුම් මිල රු. 430.52 දක්වා (2020 දී රු. 267.55) වර්ධනය විය.

3. මූල්‍ය කාර්ය සාධනය (සාරාංශය)

2021 මූල්‍ය වර්ෂය සඳහා ප්‍රධාන කාර්යාලයේ ආදායම රු. මිලියන 308.9 ක් වූ අතර, පාරිභෝගික අංශයේ පිරිවැටුම රු. මිලියන 364.5 ක් විය. සමස්ත මූල්‍ය ප්‍රතිඵලය පහත පරිදි වේ:

විස්තරය	2021.12.31 (රු.)	2020.12.31 (රු.)
ආදායම	1,204,225,143	1,017,246,783
විකුණුම් පිරිවැය	(1,740,151,580)	(1,262,225,386)
දළ අලාභය	(535,926,437)	(244,978,603)
වෙනත් ආදායම්	308,992,292	112,683,370
ශුද්ධ අලාභය (බදු පෙර)	(459,399,025)	(348,392,616)

4. විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශ සහ ක්‍රියාත්මක කිරීම්

ආයතනික යහපාලනය සහ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම උදෙසා විගණන හා කළමනාකරණ කමිටුව විසින් පහත සඳහන් ප්‍රධාන අංශ කෙරෙහි අවධානය යොමු කර නිර්දේශ ලබා දී ඇත.

4.1 ඉඩම් හා දේපළ කළමනාකරණය

මොන්ටක්‍රිස්ටෝ වතුයාය: අනවසර ගස් කැපීම් සම්බන්ධයෙන් නීතිමය උපදෙස් ලබා ගැනීම සහ බදු ගිවිසුම් උල්ලංඝනය කරන පාර්ශවයන්ගේ ගිවිසුම් අහෝසි කිරීමට පියවර ගැනීම. ආයතනය සතු 150 කට අධික බදු ගිවිසුම් සමාලෝචනය කර, කොන්දේසි කඩකරන්නන් අසාදු ලේඛනගත (Black List) කිරීමට තීරණය විය.

හන්තාන වතුයාය: නිල නිවාසවල අනවසරයෙන් රැඳී සිටින්නන්ට එරෙහිව 'රජයේ ඉඩම් සන්තකයේ තබාගැනීමේ පනත' යටතේ නීතිමය පියවර ගැනීම සහ ඔවුන් භාවිතා කරන විදුලිය සඳහා වෙනම මීටර් සවිකර අයකර ගැනීමට උපදෙස් දෙන ලදී.

කන්දල්ඔය සහ නාගස්තැන්න: වතුවල සිදුවූ මුදල් වංචා සම්බන්ධ නඩු කටයුතු (මහනුවර මහාධිකරණය) අඛණ්ඩව අධීක්ෂණය කිරීම.

4.2 මානව සම්පත් සහ ඵලදායීතාව

කම්කරු උපයෝජනය (Labour Utilization): වතුයායන්හි කම්කරු ශ්‍රමයෙන් 80% ක් අනිවාර්යයෙන්ම දළු නෙලීම සහ කිරි කැපීම සඳහා යෙදවිය යුතු බවට වක්‍රලේඛ නිකුත් කරන ලදී. මේ පිළිබඳ මාසික ප්‍රගතිය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කළ යුතුය.

කම්කරු නාම ලේඛනය: සාමාන්‍ය පෙරට්ටුව (General Muster) මගින් භෞතික සත්‍යාපනයක් සිදුකර නාම ලේඛන යාවත්කාලීන කිරීම අනිවාර්ය කර ඇත.

කාර්ය සාධනය මත ඇගයීම: අංශ ප්‍රධානීන් වාර්ෂික ඉලක්ක සපුරා නොමැති නම්, 2021 සිට වැටුප් වර්ධක අත්හිටුවීමට (Deferment) තීරණය විය.

සාමාන්‍යාධිකාරී ධූරය: ආයතනයේ ස්ථාවරත්වය උදෙසා පවතින නීතිමය බාධාවන් ඉවත් වූ වහාම ස්ථීර සාමාන්‍යාධිකාරීවරයෙකු බඳවා ගැනීමට කටයුතු කරනු ඇත. පුද්ගලික ලිපිගොනු විධිමත්ව පවත්වාගෙන යාමට මානව සම්පත් අංශයට උපදෙස් දී ඇත.

4.3 මූල්‍ය පාලනය සහ ගිණුම්කරණය

හිඟ මුදල් අයකර ගැනීම: රජයේ ආයතනවලින් අයවිය යුතු දීර්ඝකාලීන හිඟ මුදල් සම්බන්ධව විශේෂ විගණනයක් සිදු කිරීම සහ බදු ඉඩම් ශේෂයන් සංසන්දනය කිරීම.

ගිණුම් නිරවද්‍යතාව: 2017-2019 අවසන් ගිණුම් විගණනය කිරීම, අත්තිකාරම් ගිණුම් විශ්ලේෂණය සහ පාරිතෝෂික ශේෂයන්ගේ නිරවද්‍යතාව තහවුරු කිරීමට පියවර ගන්නා ලදී.

පාඩු ලබන ව්‍යාපෘති: මණ්ඩලයේ මූල්‍ය ස්ථාවරත්වය වෙනුවෙන්, පාඩු ලබන අමතර ව්‍යාපෘති (එළවළු වගාව, පිටත තේ විකිණීම) අත්හිටුවා ප්‍රධාන ව්‍යාපාරය වන තේ කර්මාන්තය වෙත පමණක් අවධානය යොමු කිරීමට තීරණය විය.

5. මානව සම්පත් සංවර්ධනය

සේවක මණ්ඩලයේ දැනුම හා කුසලතා වර්ධනය උදෙසා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය (NIPM), ශ්‍රී ලංකා පදනම් ආයතනය සහ කම්කරු දෙපාර්තමේන්තුව හා එක්ව තාක්ෂණික, මූල්‍ය, විනය පාලනය සහ සෞඛ්‍ය පිළිබඳ වැඩමුළු රැසක් මෙම වසර තුළ පවත්වන ලදී.

2021 වසරේ විගණන විමසුම් සහ ඒවා නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග

විගණන විමසුම්	නිවරදි කිරීමට ගත් ක්‍රියා මාර්ග
(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 55 ඡේදය ප්‍රකාරව හා මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති 3.2.3 ප්‍රකාරව වත්කම් පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසු එම වත්කම ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවද, 2021 වර්ෂය තුළදී වතුයායන් සහ ප්‍රධාන කාර්යාලය විසින් මිලදී ගන්නා ලද රු.22,393,425ක් වූ ස්ථාවර වත්කම් මිලදී ගත් දිනය නොසලකා සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කර තිබුණි.	ප්‍රධාන කාර්යාලයේ 2022 වර්ෂයේ මිලදි ගත් දිනයේ සිට නිවැරදිව ක්ෂය කිරීම සිදුකර ඇති අතර, 2021 වර්ෂයේ මිලදි ගත් වර්ෂයටම කල ක්ෂය කිරීම 2022 වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු කර ඇත. වතු අංශයද 2021 වර්ෂයේ සිටම නිවැරදිව මිලදි ගත් දිනයේ සිට ක්ෂය කිරීම සිදුකර ඇත.
(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 12 ඡේදය ප්‍රකාරව රු.40,769,359ක් වූ පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් වටිනාකම වාර්ෂිකව තක්සේරු නොකර ස්ථාවර අගයක් ලෙස ඉදිරියට ගෙන එමින් පැවතුණි. එසේම එම ශේෂය සත්‍යාපනය කර ගැනීම සඳහා වාර්ෂිකව යාවත්කාලීන කරන ලද ගස් සංගණන හා තක්සේරු වාර්තාද විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී විකුණූ පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් වල විකුණුම් ආදායම රු.131,963,104 ක් වුවද ගස්වලට අදාල පිරිවැය වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම ප්‍රමිතියෙහි 54 (ඇ) ඡේදය ප්‍රකාරව රු.9,052,059ක් වූ වෙනත් ජීව විද්‍යාත්මක වත්කම්වල ක්ෂය ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.	2022, 2023, 2024 වර්ෂවල තක්සේරු වාර්තා වන සම්පත් අංශය විසින් ලබාගෙන ඇත. ඒ අනුව 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් සටහන් මගින් (පිටු 17)(5.5) මගින් අනාවරණය කර ඇති පරිදි 2024 වර්ෂයේදි ගිණුම මගින් අවශ්‍ය ගැලපිම් සිදුකර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
“ (ඊ) සමාලෝචිත වර්ෂයේදී කල්බදු පදනම යටතේ ලබාගෙන තිබුණු රු.6,150,000ක් පිරිවැය වූ ට්‍රැක්ටර් රථ 03 ක කල්බදු වගකීම ලෙස 2021 වර්ෂයට අදාලව රු.3,101,640ක් මූල්‍ය ප්‍රකාශනය තුළ හඳුනාගත යුතු වුවද, මණ්ඩලය විසින් රු.5,452,725ක් හඳුනා ගැනීම හේතුවෙන් කල්බදු වගකීම රු.2,351,085කින් අධිගණනය වී තිබුණි.”	මෙම රු. 7,216,118/- වූ ජීව විද්‍යාත්මක වත්කම්වල ශේෂය දිගින් දිගටම පැවැත එන ශේෂයන් වන අතර, එහි නිවැරදිභාවය සොයා බලා ඉදිරියේදි සුදුසු පියවර ගැනිමට කටයුතු කරමි. ක්ෂය අනුපාත හා පරිණත කාලය හෙලිදරවු කර නොතිබුණු කරාබුනැටි හා කෝපි වගාවන්ට අදාළ තොරතුරු 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් මගින් හෙලිදරවු කිරීමට කටයුතු කර ඇත.
(උ) සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පරිණත කාලය ඉක්මවූ රු.10,000,918ක් වූ වගාවන් පරිණත වගාවට මාරු නොකර නොමේරු භෝග යටතේ දක්වා තිබුණි	“වර්තමානයේ කල්බදු ණයහිමි ගිණුමේ ශේෂය තුළ කල්බදු ගිවිසුමට අනුව කල්බදුකරු වෙත ගෙවිය යුතු මුළු පොළිය හා වත්කමේ පිරිවැය යන දෙකම සඳහන් කර ඇති නමුත් LKAS 17 කල්බදු ප්‍රමිත ප්‍රකාරව 2024 වර්ෂයේදි අවශ්‍ය ගැලපිම් කිරීමට කටයුතු කරමි.

(එ) 2021 දෙසැම්බර් 31 දිනට පාරිභෝජ්‍ය අංශයේ පැවති රු.2,744,595 ක තොග ශේෂය තුළ ඇතුළත් රු.2,369,453ක් වූ තේ තොගය භෞතිකව නොමැති වුවද තොගයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම වතුයායන් 11කට අදාලව රු.2,761,476ක තොග ශේෂය භෞතිකව නොපැවතිය ද මූල්‍ය ප්‍රකාශන තුළ තොග වටිනාකම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි	මුල්හල්කැලේ වතුයාය සම්බන්ධව පවතින ශේෂ පත්‍රයේ ගෙවියයුතු පාරිතෝෂික ශේෂය ලෙස හර අගයක් ලෙස පෙන්නුම් පෙන්නුම් කරන අතර මෙම ශේෂ සම්බන්ධව තොරතුරු ආයතනය සතුව නොමැත. එම නිසා එම ශේෂය 2022 වර්ෂයේදි ශේෂ පත්‍රය තුළ එම ශේෂය වෙනම වෙන්විමට කටයුතු කරමි.
(ඔ) මොන්තක්‍රිස්තෝ වතුයාය 2003 වර්ෂයේ සිට විවිධ පාර්ශව වෙත බදු දී තිබෙන අතර මෙම වතුයායේ දේපල පිරියත හා උපකරණ ශේෂය සහ ජීව විද්‍යාත්මක වත්කම්වල පිරිවැය මූල්‍ය ප්‍රකාශන අනුව රු.32,168,955ක් විය. මෙයට අදාලව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර වත්කම් සම්බන්ධයෙන් භෞතික පරීක්ෂාවක්ද මණ්ඩලය විසින් සිදු කර නොතිබුණු බැවින් එම වත්කම්වල අගය හා පැවැත්ම විගණනයට තහවුරු කර ගැනීමට නොහැකි විය.	මෙම මොන්තක්‍රිස්තෝ වතුයායේ වතුකම්වලට අදාළව ලිපි ලේඛන නොමැති බැවින් මෙම වත්කම් ක්ෂය කිරීම සිදුකර නොමැත.